# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2442/64 – 2025 ජුනි මස 28 වැනි සෙනසුරාදා - 2025.06.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/05/2018/40.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.12.28 දිනැති හා අංක 2208/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2020.12.10 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 02, කොල්වින් ආර් ද සිල්වා මාවත, අංක 457 හි පිහිටි සමස්ථ ලංකා වෙළෙඳ හා කර්මාන්ත කම්කරු සංගමය සහ අනෙක් පාර්ශ්වය වශයෙන් 1. කොළඹ 02, පාක් වීදිය, අංක 33, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, 12 වන මහල පිහිටි ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් 2. කිරිල්ලවල, නුවර පාර, නො. 333ඒ හි පිහිටි වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 80/2020 හා 2025.05.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

නඩු අංකය - A/80/2020
යොමු අංකය - IR/COM/05/2018/40

සමස්ථ ලංකා වෙළඳ හා කර්මාන්ත කම්කරු සංගමය,
නො. 457,
කොල්වින් ආර් ද සිල්වා මාවත,
කොළඹ 02.

*පළමු පාර්ශ්වය*

01. ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්,
12 වන මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල,
නො. 33, පාක් වීදිය, කොළඹ 02.

02. වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
නො. 333 ඒ,
නුවර පාර, කිරිල්ලවල.

*දෙවන පාර්ශ්වය*

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 04 සහ 1968 අංක 39(1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය ) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ගරු කම්කරු ඇමතිතුමන් වෙත පැවරී ඇති බලතල අනුව, ඉහත පාර්ශ්වයන් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා සමාංක 2020.12.10 දින දරන නියෝගයෙන් බේරුම්කරු වශයෙන් මා පත් කර, මා වෙත යොමු කොට ඇත.

මෙම ආරාවුලට හේතුවී ඇති කරුණු වනුයේ, ඩොල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් ඌව කුඩා ඔය ගොවිපළෙහි සේවකයින්ට වයස අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමට ගෙන ඇති තීරණයෙන් සේවක පාර්ශ්වයට අගතියක් සිදුවී තිබේද ? එසේ අගතියක් සිදුව ඇත්නම් ලැබිය යුතු සහන කවරේද යන්න සහ 2018 ජනවාරි මාසයේදී වැඩ වර්ජනය කළ දින 15 ට අදාළ වැටුප වැඩ වර්ජිත සේවකයන්ට හිමිවිය යුතුද යන්න පිළිබඳව වේ.

ඒ අනුව මීට පෙර පූර්වගාමී බේරුම්කරු ඉදිරියේ පවත්වාගෙන යන ලද නඩු විභාගය මා ඉදිරියේ පවත්වාගෙන යන බවට සියලු පාර්ශ්වයන් පිළිගැනීමෙන් පසු ඊට අදාළ ලේඛන ගොනු කිරීමෙන් පසු ඒ අනුව 2021.02.25 වන දින මෙම නඩුවේ පැමිණිලිකරු වන සමස්ථ ලංකා වෙළඳ කර්මාන්ත හා කම්කරු සංගමය තම තොරතුරු ප්‍රකාශය සහ ඒ සමග ලකුණු කරන ලද A1 සිට A20 දක්වා ලේඛන ද සමගද, මෙම නඩුවේ 1 වන වගඋත්තරකරු වන ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමටඩ් මෙම පිළිතුරු ප්‍රකාශය X1 සිට X4 දක්වා ලේඛන සමගද මෙහි 2 වන වගඋත්තරකරු වන වීරසිංහ මැන් පවර් සප්ලයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය 2021.01.06 වන දින පිළිතුරු ප්‍රකාශය ගොනු කර ඇත.

ඒ අනුව මෙකී සාක්ෂි විභාගය වර්ෂ 2022.11.16 වන දින ආරම්භ කළ අතර, පැමිණිලිකරුවන් වෙනුවෙන් සාක්ෂිකරුවන් තිදෙනෙක් සාක්ෂි ලබාදුන් අතර, 1වන වගඋත්තරකාර ආයතනය හා 2 වන වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් එක් සාක්ෂිකරුවෙක් බැගින් කැඳවන ලදී. පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබාදුන් සාක්ෂිකරු විශේෂයෙන් සඳහන් කරන ලද්දේ ඔවුන් මීට පෙර රණබිම ආයතනය යටතේ සේවය කළ බවත්, පසුව 2 වන වගඋත්තරකාර ආයතනය යටතේ ඩෝල් ලංකා ආයතනය වෙත සේවාව සැපයීම කළ බවත්ය. මූලික වශයෙන්ම පැමිණිලිකරුවන් විසින් අවධානය යොමු කරන ලද්දේ පැමිණිලිකරුවන්ගේ තොරතුරු ප්‍රකාශයේ A20 ලෙස ලකුණු කර ඇති (මෙම ලේඛනය සමහර ස්ථානවල පැමිණිළිකරුවන් විසින් A19 ලෙසද ලකුණු කර ඇති බව නඩු ගොනුව පරීක්ෂා කිරීමේදී පෙනීයයි.) 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 12 (1) වගන්තිය යටතේ ඇති ආරාවුල් සමාදාන කිරීමෙන් නිරවුල් කිරීමේ 2017.02.09 වන දින ඇති කරගන්නා ලද කොන්දේසි පත්‍රයයි.

තවද, පැමිණිලිකාර පාර්ශ්වය විසින් අවස්ථා කිහිපයකදී මෙහි 1 වන වගඋත්තරකරු වෙත සේවකයන්ට වන අපහසුතා පිළිබඳ දැනුවත් කරන ලද ලිපි හා ඒ පිළිබඳ මොණරාගල සහකාර කම්කරු කොමසාරිස් වෙත විවිධ අවස්ථාවන් හි ගොනු කළ ලිපි A2 සිට A15 දක්වා ලේඛන ලකුණු කර ඉදිරිපත් කර ඇත.

මෙහිදී වර්ෂ 2013.09.11 වන දින ආරාවුල් නිරවුල් කිරීමේ කොන්දේසි පත්‍රයේ පිටපත් A1 ලෙස ඉදිරිපත් කර ඇත. මීට පිළිතුරු වශයෙන් 1 වන වගඋත්තරකාර සමාගම තම ආයතනය වෙනුවෙන් එක් සාක්ෂිකරුවෙක්ද, ඔහු මාර්ගයෙන් 1වි1 සිට 1වි 5 දක්වා ලේඛන ලකුණු කොට ඉදිරිපත් කර ඇත.

මෙම නඩුවේ 2 වන වගඋත්තරකරුවන් විසින් එක් සාක්ෂිකරුවෙක් කැඳවන ලද අතර, 2R(1) සිට 2R [10(b)] දක්වා ලේඛන ලකුණු කරන ලදි.

මෙහිදී බේරුම්කරු විසින් විසඳිය යුතු ප්‍රධානම කරුණ වන්නේ, එනම් කාර්මික ආරාවුල සඳහා හේතුවන කරුණ වනුයේ ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් ඌව කුඩා ඔය ගොවිපළේ සේවකයින්ට වයස අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට අවස්ථාව ලබා නොදීමට ගෙන ඇති තීරණයෙන් සේවකයන්ට අගතියක් සිදු වී තිබේද? එසේ නම් ලැබිය යුතු සහන කවරේද යන්න සහ 2018 ජනවාරි මස වැඩ වර්ජනය කළ දින 15 ට අදාළ වැටුප වැඩ වර්ජනය කළ සේවකයන්ට ලැබිය යුතුද යන්න වේ.

කෙසේ නමුදු පැමිණිල්ලේ සාක්ෂිකරුවන්ගේ සාක්ෂි සලකා බැලීමේදී පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි ලබාදුන් අංගම්පොඩිගේ ඉෂාර සමන්ප්‍රිය විශේෂයෙන්ම සලකා බැලීමේදී සහ ඔහු හරස් ප්‍රශ්න වලට භාජනය වීමේදී එකී සේවකයා ඇත්ත වශයෙන්ම සේවය කරනු ලැබුවේ. කුමන ආයතනයටද යන්න, හෝ ඒ පිළිබඳව දැනුමක් තිබූ බවට කිසිදු අනාවරණයක් නොවූ බවය.

සාක්ෂි විශ්ලේෂණය කිරීමේදී පැහැදිලිව පෙනී යනුයේ. මෙම නඩුව 2 වන වගඋත්තරකාර සමාගමේ සේවකයින් වගඋත්තරකාර 1 වන සමාගම වන ඩෝල් ලංකා සමාගමට සේවකයින් සැපයීමේදී අදාළ පාර්ශ්වයන් සමග ලිඛිත ගිවිසුමකට පැමිණි බවත්. එම සේවකයින් සම්බන්ධව සියළු ගෙවීම් කටයුතු හා විනය කටයුතු එකී අදාළ ගිවිසුම් කොන්දේසි මත සිදුකරන ලද බවත්, එකී ගොවිපළේ සේවකයින් අදාළ සේවා සැපයීමේ සමාගම සතුවන අතර, එකී සේවකයින්ගේ සේවයෙන් ඉවත් කිරීම විනය කටයුතු 2 වන වගඋත්තරකාර සමාගම සිදුකරන ලද බවත්, මෙම සේවකයින්ට වැටුප් හා අනෙකුත් සේවක ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම 2 වන වගඋත්තරකාර සමාගම විසින් සිදු කරන ලද බවත්, මෙකී සේවකයින්ගේ ප්‍රසාද දීමනා, වැටුප් වැඩිකිරීම, විනය ක්‍රියාමාර්ග අනුගමනය කිරීම 2 වන වගඋත්තරකාර සමාගමේ වගකීමක් වන බවට එකී සමාගම විසින් 1වි1, 1වි3, 1වි4 සහ 1වි5 සහ එකී සමාගම විසින් ඉදිරිපත් කරන ලද ඉහත ලේඛන අනුව පෙනීයයි.

තවද, 2 වන වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛන සලකා බැලීමේදී කාර්මික ආරාවුල මෙකී සමාගම ඩෝල් ලංකා 1 වන වගඋත්තරකාර සමාගමට සේවකයන් සැපයීමට භාර ගැනීමට පෙර සිටම පවතින ආරාවුලක් බව පෙනී යන අතර, විශේෂයෙන් 2 වන වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද 2R1, 2R2, 2R3, 2R4, 2R5, ලේඛන සලකා බැලීමේදී දෙවන වගඋත්තරකාර සමාගම සෑම අවස්ථාවකදීම සේවකයින් වෙත එකී සමාගම විසින් ගෙවිය යුතු මුදල් ගෙවා ඇති බවත් පැහැදිලි වේ.

තවද එකී 2 වන වගඋත්තරකාර සමාගම ඉදිරිපත් කරන ලද 2R7, 2R7A, 2R7B, 2R7C, 2R7D, 2R7E, 2R8, 2R8A, 2R8B, 2R8C, 2R8D, 2R8E, 2R8F, 2R8G, 2R9, 2R10, 2R10A, 2R10B, ලේඛන සලකා බැලීමේදී වැඩිදුරටත් පැහැදිලිවන බවත්, තවද එකී ලේඛනයන් හී සඳහන් ගෙවන මුදල් සම්බන්ධයෙන් හෝ එකී දීමනා ලද සේවකයින් සම්බන්ධයෙන් වූ ඉහත කී සාක්ෂි හා ලේඛන සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශ්වය කිසිදු හබ කිරීමකින් තොරව පිළිගෙන ඇති බවයි.

පළමුවන පාර්ශ්වය හෙවත් පැමිණිලිකරු ඉදිරිපත් කරන ලද ලේඛන හා සාක්ෂි සලකා බැලීමේදී මෙකී කාර්මික ආරාවුල බොහෝ කලෙක සිට පැවති බවත්, දෙවන වගඋත්තරකාර සමාගම අදාළ සේවකයින් සැපයීම බාර ගන්නා ලද අවස්ථාවේදීද ඒ ආකාරයෙන්ම පැවති බව පැහැදිලි වේ.

පළමුවන පාර්ශ්වය හෙවත් පැමිණිලිකරුවන් ඉදිරිපත් කරන ලද A1, A2, A4, A5, A6 ලේඛන සලකා බැලිමේදී පළමුවන පාර්ශ්වය මෙකී කාර්මික ආරාවුල විසඳා ගැනීම සඳහා දිගින් දිගටම මෙම නඩුවේ 1 වන වගඋත්තරකරු වන ඩෝල් සමාගම මගින් කටයුතු කර ඇති බව පැහැදිලිව පෙනියන නමුත්, පළමුවන පාර්ශ්වය (පැමිණිලිකාර පාර්ශ්වය) විසින් ලකුණු කර ඇති A3 ලේඛනය මගින් පැහැදිලිව පෙනී යනුයේ. 2 වන වගඋත්තරකාර සමාගම තමාගේ සේවායෝජකයා යන්න මත දැනුමක් පළමුවන පාර්ශ්වය සතුව පැවති බවයි.

එසේම පළමුවන පාර්ශ්වය ඉදිරිපත් කරන ලද ලේඛන හා සාක්ෂි මගින් ආරාවුලට හේතු වී ඇති කරුණු නිශ්චිත බවකින් තොර බව පෙනී යන අතරම, පළමුවන වගඋත්තරකරු වන ඩෝල් ලංකා සමාගම නෛතිකව බැඳී නැති කරුණක් සම්බන්ධයෙන් දිගින් දිගටම කරුණු දක්වා ඇති බවත් පෙනී යයි.

1 වන පාර්ශ්වය විසින් දිගින් දිගටම තමාගේ සේවායෝජකයා ලෙස මෙහි 1 වන වගඋත්තරකරු ලෙස දැක්වීමට උත්සාහ කළද, 1 වන පාර්ශ්වය විසින් ඉදිරිපත් කර ඇති A3 ලේඛනය මගින් මෙන්ම 1 වන පාර්ශ්වය විසින් සාක්ෂියට කැඳවන ලද " අංගම්පොඩිගේ ඉෂාර ... යන අයගේ සාක්ෂි මගින් ද සනාථ වනුයේ පළමුවන පාර්ශ්වයේ සේවායෝජකයා කවුරුද යන්න මතම පැහැදිලි හෝ නිශ්චිත දැක්මක්, 1 වන පාර්ශ්වයට නොතිබූ බවය.

තවද, 1 වන පාර්ශ්වය විසින් සාක්ෂියට කැඳවන ලද " ඩී. එම්. ෂෙල්ටන් " යන සාක්ෂිරුගේ සාක්ෂියෙන්ද හෙළිවූයේ තමන් අවුරුදු 58 දී විශ්‍රාම ගිය බවත්, ඊට අදාළ සියළු දීමනා ලබාගත් බවත්ය.

විශේෂයෙන්ම 1 වන පාර්ශ්වය විසින් සාක්ෂිකරුවන් කැඳවීමේදී එකී සාක්ෂිකරුවන් කුමක් අරබයා සාක්ෂි ලබා දෙන්නේද යන්න පිළිබඳව විශාල ගැටලුවක් වූ අතර, විශේෂයෙන් පැමිණිලි පාර්ශ්වය විසින් A1B ලෙස ගොනු කර ඇති ලේඛනයේ සඳහන් "සිරිල් පියසේන විජයහේවා," යන අයගේ දිවුරුම් ප්‍රකාශය මගින් දක්වා ඇති කරුණු කිසිදු තහවුරු කිරීමක් සිදුකර නොමැති සාක්ෂියක් බවත්ය.

ඒ අනුව 1 වන පාර්ශ්වයේ සාක්ෂි මගින් තමාගේ සේවායෝජකයා කවුරුද යන්න නිශ්චිතව හඳුනා ගැනීමකින් තොරව සාක්ෂි හා ලේඛන ඉදිරිපත් කර ඇති බව පෙනී යයි.

තවද 2 වනවගඋත්තර කරුගේ සාක්ෂිය හා ලේඛන සලකා බැලීමේදී එකී ආයතනය විසින් අවශ්‍ය වේලාවන්හිදී නිසිපරිදි අදාළ දීමනාවන් ගෙවා ඇති බව පැහැදිලි වන අතර, එකී 2 වන වගඋත්තරකාර සමාගම විසින් ඉදිරිපත් කරන ලද සාක්ෂි හා ලේඛන කිසිදු ආකාරයක අභියෝගයකට ලක්කිරීමක් ද සිදුනොකර ඇති බව පෙනී යයි.

1 වන පාර්ශ්වය විසින් තමන්ගේ සේවකයින්ට, 1 වන හා 2 වන වගඋත්තරකාර සමාගම විසින් බලෙන් සේවයෙන් විශ්‍රාම ගන්වා ඇති බවට දිගින් දිගටම ප්‍රකාශ කළද එවැනි ආකාරයේ සාක්ෂිකරුවන් ගෙන් වීමට 1 වන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

තවද 1 වන පාර්ශ්වය විසින් බලෙන් විශ්‍රාම ගන්වන ලද සේවක සේවිකාවන්ගේ ලැයිස්තුවක් ඉදිරිපත් කරන ලද නමුත් ඇත්ත වශයෙන්ම එවැනි සේවක සේවිකාවන් සාක්ෂිවලට නොකැඳවීමෙන් එවැනි ආරාවුලක් පැවතියේද යන්න නිගමනය කිරීමද අපහසු වේ.

තවද, එකී 1 වන පාර්ශ්වය විසින් බලහත්කාරයෙන් විශ්‍රාම ගන්වන ලදැයි කියනු ලබන සේවකයින් වෙත නිසි පරිදි දීමනාවක් ගෙවූ බවට 2 වන වගඋත්තරකාර ආයතනය මගින් ඉදිරිපත් කරනු ලබන ලේඛන නොසලකා හැරීම, එකී 2 වන වගඋත්තරකාර ආයතනය වෙත කරනු ලබන අසාධාරණයක් ද වේ.

විශේෂයෙන් 1 වන පාර්ශ්වය විසින් ප්‍රකාශ කරනු ලබන බලෙන් විශ්‍රාම ගන්වන ලද සේවකයින් සාක්ෂියට නොකැඳවන ලැබුවද 1 වන වගඋත්තරකරු හා 2 වන වගඋත්තරකරුවන් විසින් එකී අදාළ සේවකයින් සම්බන්ධයෙන් ගෙවන ලද දීමනාවන් සම්බන්ධ ලිඛිත සාක්ෂි හා 1 වන පාර්ශ්වය හා 2 වන වගඋත්තරකරු අතරත් 2 වන වගඋත්තරකරු හා 1 වන වගඋත්තරකරුවන් අතරත් ඇති වී තිබෙන ලිඛිත ගිවිසුම ගැන අවධානය යොමු කර තිබීම වැදගත් වේ.

1 වන පාර්ශ්වය හා 1 සහ 2වන වගඋත්තරකරුවන් අතර වරින්වර කාර්මික ආරාවුල් ඇති වුවත් 1 වන හා 2 වන වගඋත්තරකරුවන් තමාගේ 1වී5, 1වී3, 1වී1 ගිවිසුම බරපතල ලෙස උල්ලංඝනය කිරීමක් හෝ ඒ පිළිබඳ ලිඛිත හෝ වාචික සාක්ෂියක් ඉදිරිපත් කිරීමට 1 වන පාර්ශ්වය අපොහොසත් වී ඇත.

ඉහත කී කරුණු සලකා බැලීමේදී,

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වන

(1) “ ඩෝල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයට අයත් ඌව කුඩා ඔය ගොවිපළෙහි සේවකයින්ට වයස අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට, අවස්ථාව නොදීමට ගෙන ඇති තීරණයෙන් සේවක පාර්ශ්වයට අගතියක් සිදු වී තිබේද?

(2) 2018 ජනවාරි මාසයේදී වැඩ වර්ජනය කළ දින 15 ට අදාළ වැටුප වැඩ වර්ජිත සේවකයන්ට හිමිවිය යුතුද යන්න..” කාරණාවලදි

ඉහත කී පළමුවන කාරණය සම්බන්ධයෙන් අදාළ සේවකයින්ට අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට අවස්ථාව නොදීම සම්බන්ධයෙන් කිසිදු ආකාරයේ ප්‍රමාණවත් සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බවය.

ඉහත කී 2 වන කාරණයේදී 1 වන වගඋත්තරකරු හා 2 වන වගඋත්තරකරුවන් තමන්ගේ ගිවිසුම ප්‍රකාරව නිසි පරිදි කටයුතු කර ඇති බවත්,

ඒ අනුව සේවක පාර්ශ්වයට කිසිදු අගතියක් සිදු වී ඇති බවට ප්‍රමාණවත් සාක්ෂි හා වැටුප් නොගෙවූ බවට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් නොවීම මත සේවකයින්ට අවුරුදු 55 ඉක්මවා සේවය කිරීමට ඉඩ නොසැලසීම මත සේවකයින්ට අගතියක් සිදු වී නොමැති බවත්, වර්ජිත සේවකයින් දින 15 ට අදාළ වැටුප හිමිවීමට කිසිදු සාධාරණ හේතුවක් නොමැති බවත් තීරණය කරමි.

ඒ අනුව 1 වන පාර්ශ්වය විසින් ඉල්ලා ඇති ඉල්ලීම ප්‍රතික්ෂේප කරමි.

සංජීව ඇන්තනි,
බේරුම්කරු.

2025 මැයි මස 08 වැනි දින

EOG 06 - 0285

---

මගේ අංකය: IR/COM/01/2023/13.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2024.08.27 දිනැති හා අංක 2399/25 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2024.08.08 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාතලේ, උඩුපිහිල්ල, මීගස්තැන්න පාර, 170/1බී හි පදිංචි පී.ඒ.ජී. විජේබණ්ඩා මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කුණ්ඩසාලේ, දිගන පාර, අංක 595 හි පිහිටි ප්‍රවාහන සේවා අධිකාරිය - මධ්‍යම පළාත අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 45/2024 හා 2025.06.01 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2025 ජුනි මස 18 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.**

නඩු අංකය - ඒ/ 45/ 2024
යොමු අංකය - IR/COM//01/2023/13

පී. ඒ. පී. විජේබණ්ඩා,
170/1බී,
මීගස්තැන්න පාර,
උඩුපිහිල්ල,
මාතලේ.

*පළමු පාර්ශ්වය*

ප්‍රවාහන සේවා අධිකාරිය,
මධ්‍යම පළාත,අංක. 595,
දිගන පාර,
කුණ්ඩසාලේ,

*දෙවන පාර්ශ්වය*

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර පවතින ආරාවුල සම්බන්ධයෙන් ගරු කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර මහතා විසින් 1957 අංක 14 දරන හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය ප්‍රකාරව තමාට පැවරී ඇති බලතල ප්‍රකාර එම ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් බත්තරමුල්ල පැලවත්ත සිංහපුර පාරේ අංක 117 පදිංචි සිරි සිංගප්පුලි වන මා පත්කොට ඇත.

**බේරුම් කළයුතු කරුණු**

මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සේවය කරන පී.ඒ.පී. විජේ බණ්ඩා මහතා 2005 07 07 දින වැඩ තහනමට ලක්ව නැවත සේවයේ පිහිටුවීමේදී මතු සඳහන් හිමිකම් ඔහුට තිබේද, එසේ නම් එම හිමිකම් ලබා නොදීම තුළින් ඔහුට අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේනම් ඔහුට හිමි විය යුතු සහන කවරේද? යන්නත් පිළිබඳව වේ

01. නැවත සේවයේ පිහිටුවීමේදී 2001 වසරේ පත්වීම් ලද සහකාර ප්‍රාදේශීය කළමනාකාර තනතුර සඳහා හිමිකමක් තිබේද යන්න හා එසේ හිමිකමක් තිබේ නම් එම තනතුරෙහි නොපිහිටුවීම.

02. නැවත සේවයේ පිහිටුවීමේදී අදාළ වැටුප් පරිමාණ සහ වැටුප් තලයන් සඳහා හිමිකමක් තිබේද යන්න සහ එසේ හිමිකමක් තිබේ නම් එම වැටුප් තලයන්හි නොපිහිටු වීම

03. වැඩ තහනමට ලක්ව සිටි කාලය සඳහා හිඟ වැටුප් හිමිකමක් තිබේද ? හිමිකමක් තිබේ නම් එය ලබා නොදීම

**පාර්ශ්වයන් වෙනුවෙන් පෙනී සිටීම**

අදාළ බේරුම්කරණ ක්‍රියාවලියේදී ඉල්ලුම්කාර පළමුවන පාර්ශ්වය වෙනුවෙන් නීතිඥ කේ. ජී. කුමාරසිංහ මහතා ද දෙවන පාර්ශ්වය වෙනුවෙන් සාමාන්‍යාධිකාරී යු.ආර්. ආරියවංශ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී රෝෂන්කුමාර්, පරිපාලන නිලධාරී ගීතමාලා මන්තිලක, යන අයද පෙනී සිටින ලදී.

**ආරාවුලේ පසුබිම**

පළමු පාර්ශ්වය සිය ප්‍රථම ප්‍රකාශය මගින් තමා මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු තනතුරට 2001.07.09 දින පත් කරන ලද බවත් අල්ලස් චෝදනාවකට ලක්ව 2005.07.07 දින සිය වැඩ තහනම් කරන ලද බවත් මෙම කාරණයට අදාලව විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නැති බව මෙන්ම ඊට අදාලව කොළඹ මහාධිකරණයේ පවරන ලද නඩුවෙන් 2017.03.21 වන දින තමා නිදොස් කොට නිදහස් කරන ලද බවත් දක්වා ඇත.2017.07.31 දින සිට වසර තුනක පරිවාස කාලයක්ද සහිත නව පත්වීමක් යටතේ එම අධිකාරියේ සහකාර කළමනාකාර තනතුරක් තමාට ලබා දී ඇති බවත් වසර 12 ක් පමණ සේවයෙන් බැහැරව සිටි තමාට උසස්වීම් අවස්ථා මගහැරී බරපතල අසාධාරණයක් සිදුව ඇති බවත් වැඩ තහනම් කළ අවස්ථාවේ තමා විසින් දරන ලද තනතුරට පත්කර සාධාරණය ඉටු කරදෙන ලෙසත් තවදුරටත් ඉල්ලා සිටියි.

දෙවන පාර්ශ්වය ප්‍රථම ප්‍රකාශයෙන් මෙසේ දක්වා ඇත්තේ මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු තනතුරට 2001.07.09 දින පත් කරන ලද පළමු පාර්ශ්වකරු අල්ලස් චෝදනාවකට ලක්ව 2005.07.07 දින වැඩ තහනම් කරන ලද බවත් නගන ලද චෝදනා සනාථ නොවීම නිසා ඔහුට එරෙහිව මහාධිකරණයේ පැවති නඩුවෙන් 2017.03.21 දින ඔහු නිදොස් කොට නිදහස් කර ඇති බවත් නැවත රැකියාව ලබා ගැනීම සඳහා ඔහු අභියාචනයක් ඉදිරිපත් කර ඇති බවත් 2017.07.31 දිනැති මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය අනුව පළමු පාර්ශ්වකරු වන පී.ඒ.පී.විජේබණ්ඩා මහතාට 2017.08.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සහකාර කළමනාකරු තනතුරට සමාන්තර ජේ එම් 1-1 සේවා ගණයේ තනතුරකට නව පත්වීමක් ලබාදී ඇති බවත්ය.

පළමු පාර්ශ්වය නඩුවෙන් නිදොස් කොට නිදහස් කිරීමෙන් අනතුරුව යළි සේවය ඉල්ලා සිටීමෙන් පසු මෙම කාරණය සම්බන්ධයෙන් අභ්‍යන්තරික පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති අතර ඒ අනුව ආණ්ඩුකාර කාර්යාලයේ සහකාර ලේකම් ස්වර්ණා පෙරේරා මිය කරන ලද පරීක්ෂණයකින් අනතුරුව 2017.05.31 දින ඉදිරිපත් කර ඇති වාර්තාවකින් පළමු පාර්ශ්වකරු නැවත සේවයේ පිහිටුවීම සුදුසු බවට නිර්දේශ කර තිබුනද මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතය පරිදි තීරණයක් ගෙන නැත.

2017.08.17 දාතමින් මානව හිමිකම් කොමිෂන් සභාව ලබා දී ඇති තීරණය සහ නඩුව සම්බන්ධ තොරතුරු 2017.09.21 දින අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කිරීමෙන් පසු නව පත්වීම අවලංගු කොට කිසිදු හිඟ වැටුපක් නොමැතිව 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවීමටත් සහකාර කළමනාකරු (මගී ප්‍රවාහන පරීක්ෂක) තනතුර ඔහුට ලබා දීමටත් අධිකාරිය තීරණය කර ඇත.

**බේරුම් කරන තීන්දුව ලබාදීමේදී සළකා බලා ඇති කරුණු**

පළමු පාර්ශ්වය රු. 72240-15x2460-109140 වැටුප් ක්‍රමය යටතේ 2001.07.09 දින මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකරු තනතුරට පත්කර ඇති අතර 2002.01.09 දින සේවයේ ස්ථිර කර ඇත.

මේ අතර අල්ලස් කොමිසමේ ක්‍රියාකාරීත්වයක් යටතේ අත්අඩංගුවට ගැනීම මත ආයතන සංග්‍රහයේ XLv111 හි 27- 10 වගන්තිය අනුව 2005.07.06 දින සිට පළමු පාර්ශ්වකරුගේ වැඩ තහනම් කළබව මධ්‍යම පළාත් ප්‍ර. සේ. අ. සාමාන්‍යාධිකාරීවරයා නිකුත් කළ ලිපියකින් දන්වා තිබේ.(19 පිටුව)

මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම් මහනුවර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපතිවරයා වෙත එවන ලද 2005.07.07 දිනැති ලිපියකින් අත්අඩංගුවට ගෙන ඇති නිලධාරියා සම්බන්ධයෙන් විනයානුකූල කටයුතු කරන ලෙස දන්වා තිබූ නමුත් (20 පිටුව) 2005.11.30 දිනද 2006.10.09 දිනද අරඹා ඇති මූලික පරීක්ෂණ වලින් අනතුරුව විනයානුකූල පියවරක් ගන්නට අදාල ප්‍රවාහන අධිකාරිය පියවර ගෙන නැත.

පළමු පාර්ශ්වයට එරෙහිව 2006.05.15 දින කොළඹ මහාධිකරණයේ පවරන ලද අංක එච්සිබී 1630 දරන නඩුවෙන් වසර 11 කට පමණ පසු 2017.03.29 දින ඔහු නිදොස් කොට නිදහස් කිරීමෙන් අනතුරුව (28 පිටුව) හිඟ වැටුප් සහිතව තමා නැවත සේවයේ පිහිටුවන ලෙස පළමු පාර්ශ්වය දෙවන පාර්ශ්වයෙන් ඉල්ලා තිබේ.

ඒ අනුව ඔහු නැවත සේවයේ පිහිටුවීම නිර්දේශ කර ඇති මගී ප්‍රවාහන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා එකී ඉල්ලීම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා 2017.04.04 දින යොමු කර ඇත. (44 පිටුව)

එම නිර්දේශ සළකා බලන ලද අධ්‍යක්ෂ මණ්ඩලය ඔහු යළි සේවයේ පිහිටුවනු වෙනුවට පළමුවන පාර්ශ්වයට එරෙහිව ආයතන මට්ටමින් පරීක්ෂණයක් පැවැත්විය යුතු බවට තීරණය කර තිබේ. (44 පිටුව) ඒ අනුව එම පරීක්ෂණය පැවැත්වීම සඳහා පත්කරන ලද මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්වරිය සිය පරීක්ෂණය අවසානයේ වාර්තාකර තිබුනේ ඔහු යළි සේවයේ පිහිටුවීම සුදුසු බවය. (145 පිටුව)

මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන ප්‍රවාහන විදුලිබල බලශක්ති සහ නිවාස සහ ඉදි කිරීම් අමාත්‍යාංශ ලේකම්වරයා මෙම කාරණය සම්බන්ධයෙන් ඉතා වැදගත් ලිපියක් මධ්‍යම පළාත් මගී ප්‍රවාහන අධිකාරිය වෙත එවා තිබේ (411පිටුව)

එහි මෙසේ දක්වා ඇත.... 2005.07.07 වන දින ප්‍රධාන ලේකම් විසින් මෙම පුද්ගලයාට එරෙහිව විනයානුකූල කටයුතු කරන ලෙස දන්වා ඇත. විනයානුකූලව කටයුතු කිරීම ආරම්භ කළ යුතුව තිබූ නමුත් 2017.03.21 දින ඔහු උසාවිය මගින් නිදොස් කොට නිදහස් කරන තෙක් එවැන්නක් සිදුකර නැති බව පෙනීයයි. ආයතන සංග්‍රහයේ XLViii - 19.3 වගන්තියට අනුව විනයානුකූලව කටයුතු කිරීමට ප්‍රමාණවත් කරුණු නිරීක්ෂණය වේ නම් නිලධාරියා උසාවියක් මගින් නිදොස් කොට නිදහස් කර තිබුනද ඔහුට විරුද්ධව විනයානුකූලව කටයුතු නොකිරීමට හේතුවක් නොවුවත් වසර 12 කට ආසන්න කාලයක් තුළ එවැන්නක් සිදු නොකිරීම සහ නැවත සේවයේ පිහිටුවීම සඳහා එවැන්නක් ආරම්භ කිරීම තුළින් ඒ සඳහා තීරණයක් ලබා දීමට කලක් ගතවීම මත අදාළ කාරණයට භාජනය වී සිටින නිලධාරියාට අගතියක් සිදුවන බව නිරීක්ෂණය කරමි.

ඒ අනුව පරීක්ෂණ නිලධාරියාගේ වාර්තාවේ 04 වන ඡේදයේ සඳහන් නිර්දේශ කෙරෙහිද අවධානය යොමු කරමින් පී.ඒ.පී.විජේබණ්ඩා මහතා නැවත සේවයේ පිහිටුවීම මවිසින්ද නිර්දේශ කරන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර තීරණයක් ගන්නා ලෙස දන්වමි.

2017.07.31 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදි මධ්‍යම පළාත් ආණ්ඩුකාර ලේකම් කාර්යාලයේ සහකාර ලේකම්වරිය ඉදිරිපත්කරන ලද වාර්තාව මෙන්ම අමාත්‍යාංශ ලේකම්වරයාගේ එකී නිර්දේශයද සැළකිල්ලට ගෙන නැත. පසුව 2017.08.04 දින දරන ලිපියකින් 2017.08.08 දින සිට පළමු පාර්ශ්වයට නව පත්වීමක් ලබාදෙන්නට තීරණය කර තිබේ. (අංක 47)

කරුණු ගණනාවක් නිසා මෙම නව පත්වීම භාරගන්නට තමා කටයුතු නොකළ බව පළමු පාර්ශ්වය මෙම බේරුම්කරණ නඩු විභාගය හමුවේ මෙසේ ප්‍රකාශ කර ඇත. “මට ඒ වෙනකොට වයස අවු 45 ක් සම්පූර්ණ වෙලා තිබුනා. මේකෙ පරිවාස කාලයක් දාල තිබෙනවා අවු 3 ක. නැවත වෛද්‍ය වාර්තා ලබා දෙන්න කියල කොන්දේසි දාල තිබෙනවා. අවු 45 ක් ගියායින් පස්සේ අලුත් පත්වීමක් භාරගන්න මා කිසිසේත් කැමතිවෙන්නෙ නැහැ (218 සහ 219 පිටු)

දිස්ත්‍රික් කළමනාකරුවන් බඳවා ගැන්ම සඳහා පවත්වන ලද අභ්‍යන්තර සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව ඊට අදාලව 2021.02.16 දින රැස්ව ඇති අභියාචනා මණ්ඩල රැස්වීමේදී පළමු පාර්ශ්වය 2017 දී නැවත සේවයේ පිහිටුවා තිබීමේ ප්‍රතිඵලයක් ලෙස එකී උසස්වීම ලබා ගැන්ම සඳහා අවශ්‍ය ලකුණු ප්‍රමාණය අඩුව ඇති බව දක්වා තිබීමෙන් පළමු පාර්ශ්වය දක්වන කරුණ සත්‍ය බව සනාථ වෙයි.

මෙම පත්වීම භාර නොගනිමින් තමා ඉල්ලා සිටිනුයේ නව පත්වීමක් ලබා දෙන ලෙස නොව නැවත සේවයේ ස්ථාපිත කරන ලෙස බැව් දක්වා පළමු පාර්ශ්වය 2017.08.11 දින සභාපතිවරයා වෙත අභියාචනයක් කර ඇත. (51 පිටුව)

මෙම කාරණයට අදාලව පළමු පාර්ශ්වය ශ්‍රීලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරන ලද පැමිණිල්ලක් පරීක්ෂා කිරීමෙන් අනතුරුව මධ්‍යම පළාත් ආණ්ඩුකාර සහකාර ලේකම්වරිය කර ඇති නිර්දේශය නොසළකා ඔහුට නව පත්වීමක් ලබා දී තිබීම මගින් පළමු පාර්ශ්වයේ අයිතිවාසිකම් උල්ලංඝණය කර ඇති හෙයින් සහකාර කළමනාකරු ලෙස ලබා දී ඇති නව පත්වීම අවලංගු කර ඔහු නැවත සේවයේ පිහිටුවීමට කටයුතු කර ඒ පිළිබඳව තමන් දැනුවත් කරන ලෙස එම කොමිෂන් සභාවේ 2017.08.17 දරන ලිපියෙන් දන්වා තිබේ. (57 පිටුව)

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් එවන ලද එකී ලිපිය 2017.09.21 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කර ඇති අතර එහිදි පහත සඳහන් තීරණයට එළැඹ ඇත. (61පිටුව)

" 2000 අංක 1 දරන ප්‍රඥප්තියේ 21(2) වගන්තියේ ප්‍රකාරව පත්වීම් බලධරයා අධ්‍යක්ෂ මණ්ඩලය වන බැවින් 2017.08.11 දිනැති ඔහුගේ ඉල්ලීම මත 2017.08.04 දිනැති නව පත්වීම අවලංගු කර කිසිදු හිඟ වැටුපක් නොමැතිව 2017.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ පිහිටුවීමට තීරණය කරමු. තවද දැනට සහකාර කළමනාකරු (මගී ප්‍රවාහන සේවා පරික්ෂක) තනතුර දරන අය නඩු කටයුතු විමර්ශන අංශයේ රාජකාරිත් ඉටු කරන බැවින් ඔහු පුරප්පාඩුව ඇති විමර්ශන නිලධාරි තනතුරට යවා සහකාර කළමනාකරු තනතුර පුරප්පාඩු කළ යුතුයි.

**බේරුම්කරණ තීන්දු ප්‍රකාශය හෙවත් ප්‍රදානය**

ඔවුන්ටම අදාල ප්‍රඥප්තියක් පනවාගෙන නොතිබීම නිසා අවශ්‍ය අවස්ථා වලදී ආයතන සංග්‍රහයේ ප්‍රතිපාදන මාර්ගෝපදේශ ලෙස සැළකීමට මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරිය කටයුතු කර ඇත.

ආයතන සංග්‍රහයේ II වන කොටසේ 27-15 හි සඳහන් ප්‍රතිපාදන අනුව අධිකරණ ක්‍රියාමාර්ගයන් ගනිමින් පවතින අතරතුර වුව වැඩ තහනමට ලක්කර ඇති පාර්ශ්වයක් සම්බන්ධයෙන් අභ්‍යන්තර විනය පරීක්ෂණයක් පවත්වා සිය තීන්දු ක්‍රියාත්මක කිරීමට විනය බලධාරියාට බලය ඇතත් මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්වරයාගේ නිර්දේශයට පවා පිටුපා (20 පිටුව) පළමු පාර්ශ්වයට එරෙහිව විනායනුකූල කටයුතු කිරීමෙන් බැහැරව ඇත.

අමාත්‍යාංශ ලේකම්වරයාගේ ලිපියෙන් (පිටු අංක 411) ඉතා පැහැදිලි උපදෙස් ලබා දී තිබියදී වසර 12 ක් පමණ නිහඬව සිට ඇති දෙවන පාර්ශ්වය අදාල නඩුවෙන් නිදහස් වීමෙන් පසු යළි සේවයේ පිහිටුවන ලෙස ඉල්ලා සිටි අවස්ථාවේ පළමු පාර්ශ්වකරුට එරෙහිව විනය පරීක්ෂණයක් ආරම්භ කරන්නට මධ්‍යම පළාත් මාර්ගස්ථ ප්‍රවාහන අධිකාරිය යුහුසුළුව තිබීම අදාල සේවකයා චේතනාන්විතව පීඩාවට පත්කර තිබෙන්නකි.

එම පරීක්ෂණය පැවැත්වීම සඳහා පත්කළ ආණ්ඩුකාර සහකාර ලේකම්වරිය සිය පරීක්ෂණයෙන් අනතුරුව ලබා දී ඇති නිර්දේශයන් (පිටුව 209) මෙම මධ්‍යම පළාතේ මාර්ග සංවර්ධන ප්‍රවාහන විදුලිබල බලශක්ති සහ නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශ ලේකම්වරයා මෙම කාරණය සම්බන්ධයෙන් 2017.06.05 දින ඔහු නැවත සේවයේ පිහිටුවන ලෙස කරන ලද නිර්දේශයන් සහ මග පෙන්වීම්ද (411 පිටුව) මෙම අධ්‍යක්ෂක මණ්ඩලය සැලකිල්ලට ගෙන නැත.

අදාල සේවකයා නැවත සේවයේ පිහිටුවීම වෙනුවට රාජ්‍ය ප්‍රතිපත්ති. පරිපාලන මූලධර්ම. නිර්නායක ව්‍යවස්ථා, රෙගුලාසි සහ නිලධාරී උපදෙස් හා මගපෙන්වීම් ආදිය නොසළකා උද්ධච්ඡ භාවයකින් කටයුතු කර ඇති මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ අධක්ෂ මණ්ඩලය 2017.08. 04 දින සිට පළමු පාර්ශ්වයට නව පත්වීමක් ලබා දෙන්නට තීරණය කර තිබේ. (47පිටුව)

මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරිය සඳහා දිස්ත්‍රික් කළමනාකරුවන් බඳවා ගැනීම වෙනුවෙන් පවත්වන ලද අභන්තර සම්මුඛ පරීක්ෂණයෙන් අනතුරුව ඊට අදාලව 2021.02.16 දින රැස්ව ඇති අභියාචනා මණ්ඩල රැස්වීමේදී පළමු පාර්ශ්වය 2017 දී නැවත සේවයේ පිහිටුවා තිබීමේ ප්‍රතිඵලයක් ලෙස පැරණි සේවා කාලය ගණනය කරගන්නට අවස්ථාව අහිමිව ඔහුගේ උසස්වීම් අවස්ථාද මග හැරී ඇත. (45 පිටුව)

අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිෂන් සභාව මැදිහත්වීමේ ප්‍රතිඵලයක් ලෙස පළමු පාර්ශ්වය 2017.10.01 දින සිට යළි සේවයේ පිහිටුවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුනද ඔහුට ලබා දී තිබුනේ වැඩ තහනමට ලක්වන අවස්ථාවේ දරන ලද සහකාර ප්‍රාදේශීය කළමනාකාර තනතුර නොවේ. එසේම නැවත සේවයේ පිහිටුවීමේදී ලබා දී ඇත්තේ මුල් තනතුරේ වැටුප් ක්‍රමය නොව ඊට වඩා පහළ වැටුප් පරිමාණයකි.

1. මේ සියළු කාරණා සලකා බැලීමේදී අමාත්‍යාංශ ලේකම්වරයාගේ විමසුමට අනුව සඳහන් කළ යුතුව ඇත්තේ මධ්‍යම පළාතේ ප්‍රවාහන සේවා අධිකාරියේ සේවක පි.ජී.පි.විජේබණ්ඩා මහතා 2005.07.07 දින වැඩ තහනමට ලක්වීමෙන් පසු නැවත සේවයේ පිහිටුවීමේ ක්‍රියාවලියේ දී පැහැදිලිවම ඔහු අසාධාරණයකට ලක්ව ඇති බවය.

2. නැවත සේවයේ පිහිටුවන බව දක්වමින් පළමු පාර්ශ්වය ස්ථාපනය කර ඇත්තේ ඔහු වැඩ තහනමට ලක්වන අවස්ථාවේ ලබමින් සිටි වැටුප් ක්‍රමය නොවන හෙයින් එම පෙර වැටුප් ක්‍රමයේ හිමිකම ඔහුට ලබා දිය යුතු බවය.

3. වැඩ තහනමට ලක්ව සිටි කාලය සඳහා හිඟ වැටුප් ලබා ගැන්මේ හිමිකම නැවත සේවයේ පිහිටුවීමට පාත්‍රවන පළමු පාර්ශ්වයේ අයිතිවාසිකමක් වන හෙයින් නෛතික ලෙස නැවත සේවයේ පිහිටුවන දින සිට ඔහුට හිමි හිඟ වැටුප් ගෙවිය යුතු බවය.

අර්ධ රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ සේවකයන් වෙනුවෙන් සහතික කර ඇති සාධාරණත්වය ලංකාණ්ඩුව පනවා ඇති නීති රෙගුලාසි ආදියේ පැහැදිලිව සඳහන්ව තිබියදී පවා මෙම සේවකයා සහනයක් පතමින් පාර්ලිමේන්තු සහ පළාත් පෙත්සම් කාරක සභා, අධිකරණය, මැති ඇමති අමාත්‍යාංශ ලේකම් ආදින් පසුපස දශක දෙකක පමණ කාලයක් තිස්සේ ගොස් ඇත. ඔහු සේවය කර ඇත්තේ අර්ධ රාජ්‍ය ආයතනයක වන හෙයින් ඔහුට නෛතික සාධාරණය ඉටු නොකොට හිස උදුම්මාගෙන සිටි එහි අධ්‍යක්ෂ මණ්ඩලය ලජ්ජා විය යුතුය.

ඉදිරිපත් වූ සමස්ත කාරණා මෙන්ම මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ වත්මන් සභාපතිවරයා 2024.09.03 දාතමින් මෙම බේරුම් කරණ විනිශ්චයාධිකාරය වෙත යොමු කර ඇති ලිපියේ 13 වන ඡේදයෙන් මෙම කාරණයට අදාලව යම් නියෝගයක් ලැබෙන්නේ නම් හිඟ වැටුප් ගෙවීම සම්බන්ධයෙන් සළකා බැලිය හැකි බවට සිදු කර ඇති ඉඟිය ද ( පිටු අංක 120) සැළකිල්ලට ගෙන මෙම ප්‍රදානය සිදු කරන්නෙමි.

1. පළමු පාර්ශ්වය වරදක් සිදුකර ඇති බව දෙවන පාර්ශ්වය ඔප්පු කර දක්වා නොමැති හෙයින් ඔහුගේ සේවය තහනම් කරන ලද 2005.07.07 දින සිට ඔහු සේවය තහනම් කරන ලද අවස්ථාවේ දරමින් සිටි මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සහකාර ප්‍රාදේශීය කළමනාකාර තනතුරට යළි පත්වීමේ පූර්ණ හිමිකම ඔහුට ඇත. 2014.12.30 දින මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය නිකුත්කර ඇති (පිටු අංක384) ලිපියෙන් දක්වා තිබෙන ආකාරයට මෙම අධිකාරියේ කාර්ය මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීම තුළ එම තනතුර යටපත්ව ඇති හෙයින්ද මධ්‍යම පළාත් ප්‍රවාහන සේවා අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා 2021.12.21 දින නිකුත් කර ඇති (පිටු අංක 384) ලිපියෙන් පළමු පාර්ශ්වකරු ඒ වන විට නුවරඑළිය දිස්ත්‍රික් කළමනාකරු තනතුරේ රාජකාරි ආවරණය කරමින් සිටි බව තහවුරු වන හෙයින්ද වැඩ තහනමට ලක්ව තිබීම නිසා දිස්ත්‍රික් කළමනාකරු තනතුරට උසස් වීම් අහිමිව සිටින ඔහු මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරු තනතුරුවල වැඩ ආවරණය කරන ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරවරයා ලෙස සළකා කටයුතු කළ යුතු බවට තීරණය කරමි.

2. පළමු පාර්ශ්වය වැඩ තහනමට ලක් වූ අවස්ථාවේ ලබමින් සිටි වැටුප් ක්‍රමය පාදක කරගත් වේතනයට මෙලෙස වැඩ ආවරණය කරන ජ්‍යෙෂ්ඨ සහකාර කළමනාකාරවරයාට හිමිකම ලබාදිය යුතුය.

3. බේරුම්කරණ විනිශ්චයාධිකාරය වෙත මධ්‍යම පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරියේ ගණකාධිකාරිවරයාගේ අත්සනින් සහ 2024.09.09 දාතමින් යුතුව ලබා දී ඇති 2005 ජූලි මස සිට 2017 දෙසැම්බර් මස දක්වා වන හිඟ වැටුප් වාර්තාව පදනම් කරගෙන රු. 3.480,606.43 ක මුදලක් දෙවන පාර්ශ්වය හිඟ වැටුප් ලෙස පළමු පාර්ශ්වයට ගෙවිය යුතුය.

4. ඉහත අංක 3 යටතේ දක්වා ඇති මුදලින් රු. 2,000 000, 00 ක ප්‍රමාණයක් මෙම තීරණය ගැසට් පත්‍රයේ පළකර දින 30 ක් ඉක්ම යන්නට පෙර ද ඉතිරි රු. 1,480,606.43 ක මුදල මෙම තිරණය රජයේ ගැසට් පත්‍රයේ පළකර ලිත් මාස 7 ක් යන්නට පෙර ද පළමු පාර්ශ්වය නමින් මහනුවර උතුර කම්කරු කොමසාරිස් කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කිරීමට දෙවන පාර්ශ්වය කටයුතු කළ යුතුයි.

5. කිසිදු වෙනස්කමකින් තොරව පළමු පාර්ශ්වකරුගේ පෙර සේවා කාලය ගණන් ගත යුතු අතර මධ්‍යම පළාත් ප්‍රවාහන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකාර තනතුරු පුරප්පාඩු පුරවන මුල් අවස්ථාවේම මෙම පළමු පාර්ශ්වකරුට දිස්ත්‍රික් කළමනාකාර තනතුරක් ලබා දීම සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතුය.

සේවක අර්ථසාධක අරමුදලට හෝ සේවක භාරකාර අරමුදලට අදාල කාර්යයන් සඳහා මෙම ප්‍රදානය බාධාවක් නොවන්නේය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව ප්‍රකාශ කරමි.

**සිරි සිංගප්පුලි** (එල්එල්බී.)
බේරුම්කරු

2025. ජුනි මස 01 වැනි දින දීය

EOG - 06 - 0286

මගේ අංකය: IR/COM/05/E/2014/150.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.02.14 දිනැති හා අංක 2110/36 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් 1, වත්තල, එඬේරමුල්ල, ශාන්ත ජුඩ් මාවත, අංක 9/16 හි පදිංචි ඒ.ජේ.ආර්. සෙනවිරත්න මයා 2. ඇල්පිටිය, ශ්‍රී ධීලාලංකාර මාවත හි පදිංචි ඩබ්. ආනන්ද ධනසිරි මයා 3. ගාල්ල, පෝද්දල, ගොඩකන්ද ගෙදර පදිංචි රංජිත් ගොඩකන්ද ආරච්චි මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් බත්තරමුල්ල, සෙත්සිරිපාය, 11 අදියර, 8 වන මහල හි පිහිටි වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය බාරේ තේ ශක්ති අරමුදල අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 06/2019 හා 2025.05.08 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**ඩී. කුසලානි ද සිල්වා,**
කම්කරු කොමසාරිස් ජනරාල් (රා.ආ)

2025 ජුනි මස 05 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.**

නඩු අංකය - A/06/2019
යොමු අංකය - IR/COM//05/E/2014/150

ඒ.ජේ.ආර්. සෙනෙවිරත්න මයා,
අංක 9/16, ශාන්ත ජුඩ් මාවත,
එඬේරමුල්ල,
වත්තල.

ඩබ්. ආනන්ද ධනසිරි මයා,
ශ්‍රී ධීලාලංකාර මාවත,
ඇල්පිටිය.

රංජිත් ගොඩකන්ද ආරච්චි මයා,
ගොඩකන්දෙගෙදර,
පෝද්දල,
ගාල්ල.

*පළමු පාර්ශ්වය*

එරෙහිව

තේ ශක්ති අරමුදල,
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය බාරේ,
II අදියර,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

*දෙවන පාර්ශ්වය*

*බලතල පැවරීම.-*

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා හිටපු අමාත්‍ය ගරු රවින්ද්‍ර සමරවීර මහතා වෙත අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(I) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කර මාවෙත යොමුකර ඇත.

*ආරාවුලේ ස්වභාවය.-*

"තේ ශක්ති අරමුදලේ කම්හල් කළමනාකරුවන් ලෙස සේවය කරන ලද ඒ.ජේ.ආර්. සෙනෙවිරත්න, ඩබ්.ආනන්ද ධනසිරි හා රංජිත් ගොඩකන්ද ආරච්චි යන අයගේ සේවා ගිවිසුමෙහි සඳහන් කර ඇති කම්කරු දීමනාව එතෙක් ගෙවූ ක්‍රමය වෙනස් කර මාසික ස්ථාවර දීමනාවක් කිරීමෙන්ද පසුව එය නතර කර කිරීමෙන් ද 2015 දෙසැම්බර් සිට ප්‍රවාහන දීමනාව නතර කිරීමෙන් ද, අසාධාරණයක් සිදුව තිබේද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔවුන් එකිනෙකාට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ."

*පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීම.-*

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ අංක 39 දරන නියෝගය පරිදි හා 1959 මාර්තු 02 දිනැති මෙන්ම අංක 11688 දරන ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කරන ලද 1969 කාර්මික ආරාවුල් පනතේ නියෝග සංග්‍රහයේ 21(1) දරන නියෝගයට අනුව පාර්ශ්වයන් විසින් ආරාවුලට හේතු වී ඇති කරුණු පිළිබඳව විස්තර ප්‍රකාශයන් ඉදිරිපත් කර තිබිණ. පාර්ශ්වයන්ගේ කරුණු දැක්වීමෙන් ඉක්බිතිව කිසියම් වූ සාධාරණත්ව සමථයක් කෙරෙහි පාර්ශ්වයන් යොමු කරවා ගත හැකිවේද යන්න පිළිබඳව සලකා බැලුව ද එය සාර්ථක ලෙස ගොඩනගා ගැනීමට පාර්ශ්වයන් අසමත් වූයෙන් විභාගයට ගැනීමට තීරණය කරන ලදි.

*විසඳිය යුතු ප්‍රශ්න.-*

1. පළමු පාර්ශ්වය හා දෙවන පාර්ශ්වය අතර සේව්‍ය සේවක සම්බන්ධතාවයක් පැවතියේ ද යන්න

2. එසේ පැවතියේ නම් එහි ස්වභාවය එහිදී ඔවුන් ලබන අයිතිවාසිකම් හා වරප්‍රසාද කුමන ස්වරූපයක් ගන්නේද යන්න

3. පළමු හා දෙවන පාර්ශ්වයන් අතර උද්ගතව තිබූ ගිවිසුම්වල ස්වභාවය හා ඒවා ඒකපාර්ශ්වීය වශයෙන් වෙනසකට භාජනය කළ හැකි වේද යන්න.

4. දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත ගෙවිය යුතු වූ දීමනාවන්හි ගෙවීමේ පදනම ගෙවීමේ ආකාරය සහ ප්‍රමාණයන් කුමන ආකාරයක් ගන්නේ ද යන්න.

5. අදාළ ගෙවීම්වලට පළමු පාර්ශ්වය ලබන හිමිකම් හා ඒවා ඒ ආකාරයෙන්ම ලැබීම සාධාරණ ස්වරූපයක් ගනිද යන්න.

6. යම් යම් දීමනා ගෙවීමේදී කිසියම් හිඟ ප්‍රමාණයක් පවතී ද යන්නත් එසේ පවතී නම් හා එය ලැබීමේ හෝ නොලැබීමේ සාධාරණ බවක් වේද යන්න.

*විශේෂිත කරුණු*

මෙහි පළමු පාර්ශ්වය වශයෙන් තිදෙනෙකු නම් කර තිබුණ ද ඉන් පළමුවෙන්ම නම සඳහන් සෙනවිරත්න යන අයද දිගින් දිගටම නඩු විභාගය සඳහා ඉදිරිපත් නොවීමත් ඔහු වෙනුවෙන් කිසිදු නියෝජිතයෙකු හෝ ඉදිරිපත් නොවීමත් ඒ වන විටත් පළමු පාර්ශ්වයේ නියෝජිතයා වශයෙන් ඉදිරිපත් වූ අය ද ඔහු වෙනුවෙන් කරුණු ඉදිරිපත් කිරීම ප්‍රතික්ෂේප කිරීමත් හේතු කර ගෙන ඔහු නඩු විභාගයේදී සැලකිල්ලක් නොදක්වන ඉල්ලුම්කරුවෙකු වශයෙන් සැලකීමට තීරණය කරන ලදි. ඔහු නඩු විභාගය සඳහා ඉදිරිපත් නොවුනද ඊට පිළිගත හැකි කිසිදු හේතු දැක්වීමකින් තොරව හුදෙක් පදනම් විරහිත ආකාරයෙන් කරුණු ඇතුළත් ලිපි පමණක් ඉදිරිපත් කර ඇත. නඩු විභාගයට සහභාගී නොවී ලිපි ඉදිරිපත් කිරීම තුළින් තීන්දු ප්‍රකාශයක් ලබා දිය නොහැකිය. එමෙන්ම එම ලිපි මගින් කම්කරු විනිශ්චය සභාවක් ඉදිරියේ වූ සමථයක් පිළිබඳව ද තම රැකියාව වෙනුවට විකල්ප වශයෙන් රජයේ රැකියාවක් සඳහා අවස්ථාවක් ලබා දෙන ලෙස ද ඉල්ලීම් සිදු කර තිබේ. කම්කරු විනිශ්චය සභා නියෝගයක් ක්‍රියාත්මක කිරීම හා වෙනත් රැකියා ලබා දීමේ හැකියාවක් බේරුම්කරණය වෙත නොපවතින අතර පනත මගින් එවන් බලතල බේරුම්කරණය වෙත ලබා දීමක් ද සිදු කර නොමැති පසුබිමක් තුළ මෙම ඉල්ලුම්කරු අදාළ නඩුවෙන් ඉවත් කර අනෙක් ඉල්ලුම්කරුවන් දෙදෙනා සම්බන්ධයෙන් පමණක් නඩු විභාගය පවත්වා ගෙන යාමට තීරණය කරන ලදී. එසේ නොවිනම් එය අනෙක් ඉල්ලුම්කරුවන් දෙදෙනාට මහත් අසාධාරණයක් සිදුවීමට හේතුවක් වනවා ඇත. එම නිසා ඉතිරි ඉල්ලුම්කරුවන් දෙදෙනා සම්බන්ධයෙන් පමණක් නඩු විභාගය ඉදිරියට පවත්වා ගෙන යාමට තීරණය කළෙමි.

*නඩු විභාගය සහ පාර්ශ්වයන්ගේ පිළිගැනීම්*

ඉන් ඉක්බිතිව පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් නඩු විභාගය ආරම්භ කරන ලද අතර එහිදී මූලිකවම විසඳිය යුතු ප්‍රශ්නය වූයේ පාර්ශ්වයන් අතර සේව්‍යය සේවක සම්බන්ධතාවයක් පැවතියේ ද යන්න තහවුරු කර ගැනීමය. පළමු පාර්ශ්වය වන ඉල්ලුම්කාර ආනන්ද ධනසිරි හා රංජිත් ගොඩකන්ද ආරච්චි යන අය වෙත වග උත්තරකාර පාර්ශ්වය විසින් පිළිවෙළින් වර්ෂ 2009 ක්වූ ජූනි මස 24 දිනැතිව හා වර්ෂ 2004 ක්වූ ඔක්තෝබර් මස 26 දිනැතිව නිකුත් කරන ලද පත්වීම් ලිපි ඉදිරිපත් කරන ලදි. ඊට අනුරූපව රංජිත් ගොඩකන්ද ආරච්චි යන අය වර්ෂ 2004.11.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කම්හල් කළමනාකාර තනතුරට ද පත් කර තිබේ. මේ සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වය කිසිදු හබ කිරීමක් සිදු නොකළ අතර එමගින් පාර්ශ්වයන් අතර සේව්‍යය සේවක සම්බන්ධතාවය තහවුරු කර ගත හැකි විය. එය වඩාත් තහවුරු කර ගත හැකි වූයේ එකී පත්වීම් ලිපි වල ඇතුළත් කොන්දේසි එකිනෙක ගෙන සලකා බැලීම තුළිනි.

මීළඟට සලකා බැලිය යුතු කරුණු වූයේ පත්වීමේ ස්වභාවය අයිතිවාසිකම් හා වරප්‍රසාද කුමන ස්වරූපයක් ගන්නේද යන්නය. පත්වීම් ලිපියේ පළමු ඡේදය යටතේ දක්වා තිබෙන්නේ සේවය සඳහා වාර්තා කළ යුතු ස්ථානය වන අතර දෙවන ඡේදය යටතේ දක්වා ඇත්තේ ඔවුන් වෙත හිමි වැටුප් ක්‍රමය හා දීමනා පිළිබඳවය ඒ අනුව මෙහි ඇතුළත් දෙවන ඡේදය උද්ගතව ඇති ආරාවුල කෙරෙහි මූලික වශයෙන් බලපා තිබෙන බව පෙනී යයි. ඒ පිළිබඳව ඉදිරියේදී තවදුරටත් විග්‍රහ කළ හැකිය.

පත්වීම් ලිපියේ තෙවන ඡේදය වෙන් කර තිබුනේ ඔවුන්ගේ පරිවාස කාලය හා තනතුර ස්ථිර බව ප්‍රකාශ කිරීම සඳහාය. පරිවාස භාවයෙන් මිදී ස්ථිර තනතුර ලැබීම සඳහා සාමාන්‍ය හැසිරීම කාර්යක්ෂමතාවය හා සේවා පැමිණීම සැලකිල්ලට ලක් කෙරෙන බව අවධාරණය කර තිබේ. මේ හැරුන විට හයවන ඡේදය යටතේ තේ ශක්ති අරමුදලේ නීතිරීති හා රෙගුලාසි පිළිපැදිය යුතු බවට ද දක්වන ඡේදය යටතේ සේවක අර්ථ සාධක අරමුදලේ බැඳීම් පිළිබඳව දහවන ඡේදය යටතේ රාජකාරී සම්බන්ධයෙන් දෙනු ලබන සියලුම නියෝග හා උපදෙස් පිළිපැදීම කළ යුතු බවට ද කරුණු දක්වා ඇත. අවසාන වගන්තියෙන් දැනුම් දී ඇත්තේ මෙහි ඇතුළත් කොන්දේසි යටතේ පත්වීම භාර ගැනීමට එකඟ නම් දෙවන පිටපත අත්සන් තබා ආපසු එවන ලෙසය. මෙම ඉල්ලුම්කරුවන් දෙදෙනා ඊට එකඟව ක්‍රියා කර තිබෙන බව පෙනි යයි. ඒ අනුව පළමු හා දෙවන පාර්ශ්වයන් අතර උද්ගතව තිබූ ගිවිසුම්හි ස්වභාවය ඉහත දැක්වෙන ආකාරයෙන් වන බැවින් ඊට පටහැනිව යමින් එකී කොන්දේසි ඒක පාර්ශ්වීය වශයෙන් කිසිදු පාර්ශ්වයකට වෙනස් කිරීමේ හැකියාවක්ද තිබිය නොහැකිය.

එමෙන්ම දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වය වෙත ගෙවිය යුතු වූ දීමනාවන් ගෙවීමේ පදනම ගෙවීමේ ස්වභාවය හා ගෙවීම් ප්‍රමාණයක් සම්බන්ධයෙන් සලකා බැලීමට නම් නඩු විභාගයේදී ඉදිරිපත් සාක්ෂි මත පදනම්ව නිගමනයන්ට එළඹීම අත්‍යවශ්‍ය වේ. එපමණක් ද නොව අදාළ ගෙවීම්වලට පළමු පාර්ශ්වය ලබන්නා වූ හිමිකම් හා ඒවා ඒ ආකාරයෙන්ම ලැබීමේ සාධාරණ බවත් එය එසේ නම් එහි දීමනා ගෙවීමේ දී කිසියම් නොගෙවා සිටින හිඟ ප්‍රමාණයන්ද ඒවා ලැබීමට පළමු පාර්ශ්වයට ඇති අයිතිවාසිකමේ හා සාධාරණත්වයේ ස්වරූපයන් තීරණය කිරීම සඳහාද නඩු විභාගයේ ඉදිරිපත් කෙරෙන සාක්ෂි පදනම් කර ගනිමින් තීරණයන්ට එළඹීම ද වැදගත් වන්නේය.

*මූලික විරෝධතාවය*

නඩු විභාගය ආරම්භක අවස්ථාවේදී වග උත්තරකාර පාර්ශ්වය 2020.09.07 දිනැතිව මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරන ලද අතර එහි ප්‍රධාන විරෝධතාවයන්හි දෙකක් අන්තර්ගතව තිබිණ.

කිසියම් නඩු විභාගයකදී මූලික විරෝධතාවයක් ඉදිරිපත් වූ අවස්ථාවකදී ඊට ප්‍රමුඛතාවය ලබා දී ඒ සම්බන්ධයෙන් අතුරු නියෝගයක් නිකුත් කිරීම කළ යුතු වන්නේය. බේරුම්කරණය විසින් ද එය ඒ ආකාරයෙන් අනුගමනය කරන ලදි. මූලික විරෝධතාවය ගොනු වී තිබුනේ පහත සඳහන් කරුණු මුල් කරගෙනය. එනම්

I. කාර්මික අධිකරණයට මෙම නඩුව අසා නිම කිරීමට අධිකරණ බලයක් හිමි වී නොමැති බවය.

II. පැමිණිලි පාර්ශ්වය විසින් අනිසි ප්‍රමාදයකින් යුතුව මෙම ඉල්ලීම සිදු කර ඇති බවත් සාධාරණ කාලයක් තුළ පැමිණිල්ල ගොනු නොකිරීම පිළිබඳ හේතු කිසිවක් ඉදිරිපත් කර නොමැති බවත්ය.

මෙම මූලික විරෝධතා සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශ්වය වෙතින් ද ලිඛිතව කරුණු කැඳවා ගනු ලැබූ අතර ඒ කෙරෙහි ද අවධානය යොමු කරන ලදි. ඒ කෙසේ වෙතත් අදාළ මූලික විරෝධතාවයේ පළමු කරුණ වන්නේ මෙම නඩුව අසා නිම කිරීමට අධිකරණ බලයක් මෙම අධිකරණයට නොමැති බවය. කාර්මික ආරාවුලක් සම්බන්ධයෙන් පමණක් පැමිණිල්ලක් ඉදිරිපත් වූ විට ඊට මැදිහත්ව කටයුතු කරමින් සාක්ෂි විමසා සාධාරණවූත් යුක්ති සහගතවූත් ප්‍රදානයක් ලබා දීම සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ 4(1) උපවගන්තිය ප්‍රකාරව ප්‍රතිපාදන සැලසී තිබේ. ඉදිරිපත් වූ පැමිණිල්ල සම්බන්ධයෙන් විචාරශීලීව සලකා බැලීමේදී එය සේවක වැටුපෙන් බැහැරව දීමනා වශයෙන් ගෙවීම් කිරීමට වූ කොන්දේසියක් පත්වීම් ලිපියෙහි ඇතුළත්ව පවත්නා බව ඉතා පැහැදිලිය. එම දීමනාවන් වැටුප සමඟ ගෙවනු ලබන්නක් විය හැකි වුවත් එම ගෙවීම් වැටුප නොවන බැවින් එකී දීමනා සම්බන්ධයෙන් උද්ගත වන්නා වූ ආරාවුලක් ද කාර්මික ආරාවුලක් ලෙස සැලකිය හැකිය. එම නිසා වග උත්තරකාර පාර්ශ්වයේ මූලික විරෝධතාවයේ පළමු කරුණ සම්බන්ධයෙන් වූ විරෝධතාවය මින් බැහැර කරමි.

මූලික විරෝධතාවයේ වූ දෙවන කරුණ යටතේ දක්වා ඇත්තේ පැමිණිලි පාර්ශ්වය විසින් අනිසි ප්‍රමාදයකින් යුතුව මෙම ඉල්ලීම සිදු කර තිබෙන බැවින් ද සාධාරණ කාලය තුළ පැමිණිල්ල ගොනු නොකිරිමට වූ හේතු දක්වමින් ඉදිරිපත් කර නොමැති බැවින් ද පැමිණිල්ලේ ඉල්ලීම ප්‍රතික්ෂේප විය යුතු බවටය. මෙහි අනිසි ප්‍රමාදයක් යන්නෙන් කුමක් අදහස් කරන ලද්දේ ද යන්න පැහැදිලි නැත. කෙසේ වෙතත් සාධාරණ කාලයක් තුළ පැමිණිල්ල නොකළේය යන්න පිළිබඳව අවධානය යොමු කිරීම අත්‍යවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් පැමිණිලි පාර්ශ්වය විමසීමේදී හෙළිදරව් වූයේ කම්කරු දෙපාර්තමේන්තුව වෙත මෙම ආරාවුල යොමු කරනු ලැබුවේ 2014.10.22 දින බවත් ඒ පිළිබඳව පරීක්ෂණ 2018 අප්‍රේල් මාසය දක්වාම සිදු වී තිබෙන බවත් එහිදි තීන්දු ප්‍රකාශයක් නිකුත් නොකරම එකී පැමිණිල්ල 2019 පෙබරවාරි මස දී බේරුම්කරණය වෙත යොමු කරන ලද බවත්ය. අනෙකුත් දින වකවානු කෙසේ වුවත් මෙම පැමිණිල්ල බේරුම්කරණය වෙත යොමු වී ඇත්තේ වර්ෂ 2019 පෙබරවාරි මස 02 වන දින බව සාධක සහිතව පිළිගත හැකිය. එම නිසා මූලික විරෝධතාවයේ ඇතුළත් දෙවන කරුණු එනම් සාධාරණ කාලයක් තුළ පැමිණිල්ල ගොනු නොකළේය යන්න පිළිගත නොහැකිය එපමණක් ද නොව බේරුම්කරණය වෙත පැමිණිල්ලක් ගොනු කිරිම සඳහා යම් නිශ්චිත කාල රාමුවක් හුවා දක්වා තිබෙන බවක් පනතේ ප්‍රතිපාදන අනුව දැකගත නොහැකි බැවින්ද මූලික විරෝධතාවයේ දෙවන කරුණු සම්බන්ධයෙන් බේරුම්කරණය සලකා බලන ලද්දේ පැමිණිල්ලට කිසියම් වලකා ගතනොහැකි හේතුන් මත වූ ප්‍රමාදයක් පැවතියේද නැතහොත් පැමිණිල්ලේ නොසැලකිල්ල මත ඉතා බරපතල ආකාරයේ ප්‍රමාදයක් පැවතියේද යන්න පිළිබඳව පමණි. එම නිසා ඉන් ඉක්බිතිව දෙවන විරෝධතාවය ද බැහැර කරමි. මෙම නඩුව පාර්ශ්වයන්ගේ සහභාගීත්වයෙන් යුතුව විභාගයට ගැනීමට කටයුතු කරනු ලැබිය. ඒ ආකාරයෙන් මෙම නඩුව විභාගයට ගෙන පවත්වා ගෙන යන අතරතුරදී පැමිණිලි පාර්ශ්වයට අදාළ සේවකයන් වෙත වගඋත්තරකාර පාර්ශ්වය විසින් ආරාවුලකට තුඩු දී ඇති කම්කරු දීමනාවේ හා ප්‍රවාහන දීමනාවේ කොටසක් බෙරුම්කරණය ඉදිරියේදීම ගෙවීමට පියවර ගන්නා ලදි. මෙම ගෙවීමත් සමගම වගඋත්තරකාර පාර්ශ්වය තමන් වෙත එල්ල වී ඇති චෝදනා පිළිබඳව යම් ආකාරයකින් වරද පිළිගැනීමත් සිදු කරන ලද බව බේරුම්කරණය නිරික්ෂණය කරනු ලැබීය.

***සමථ යෝජනාව***

තත්ත්වය මෙසේ පැවතියේදී පැමිණිලිකාර පාර්ශ්වය අධිකරණය වෙත ප්‍රකාශ කර සිටියේ තමන් කිසියම් වූ සමථයකට එකගතාවය දක්වන බවයි. ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයට ද පිටපත් සහිතව විස්තරාත්මකව සමථ යෝජනාව ලිඛිතව ඉදිරිපත් කිරීමට දැනුම් දුනිමි. දෙන ලද උපදෙස් අනුව එකි සමථ යෝජනාව වර්ෂ 2022 ක්වූ ඔක්තෝබර් ෂස 26 දිනැතිව ඉදිරිපත් කර තිබිණ. මේ පිළිබඳව වග උත්තරකාර පාර්ශ්වය දැනුවත් කරන ලද අතර යෝජිත සමථයකට ඔවුන් අතමැති බව දැනුම් දෙන ලදුව තඩුව විභාගයට ගැනීමට තීරණය කළෙමි.

***සාක්ෂි සම්පිණ්ඩනය***

ඒ අනුව මුලින් පළමු පාර්ශ්වයට සාක්ෂි මෙහෙයවිමට අවස්ථාව ලබා දුනිමි. එහිදී පැමිණිලිකාර රංජිත් ගොඩකන්ද ආරච්චි සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ තමා වර්ෂ 2004 නොවැම්බර් මස 01 දින කම්හල් කළමනාකාර පත්වීම ලද බවත් ඒ වෙනුවෙන් තමන්ට පත්වීම් ලිපියක්ද ලැබුණ බවත්ය. එම පත්වීම් ලිපියේ තමාට කම්කරු දිමනාව හා ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් හිමිකමක් පවත්නා බවට සටහන්ව තිබෙන බවද ඔහු සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේය. තමත් අවසන් වරට සේවය කරමින් සිටියේ වලහන්දූව තේ ශක්ති කර්මාන්ත ශාලාවට අනුයුක්තව බවත් තමාට අවසාන කාලය තුළ කම්කරු දිමනාව මසකට රු.38000/- ක්ද ප්‍රවාහත දිමනාව මසකට රු 15000/- ක්ද වශයෙන් ලැබුණ බවත් ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි. මේ අතරතුර අමාත්‍යාංශ තීරණයක් මත තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුගත කිරිම හේතුවෙන් වර්ෂ 2016 ක්වූ දෙසැම්බර් මස 31 වන දින තම සේවය අවසන් වූ බව ද සාක්ෂිකරු කියා සිටියේය. කෙසේ වෙතත් තමන්ට වර්ෂ 2015 පෙබරවාරි මස සිට 2016 දෙසැම්බර් මස 31 දක්වාම කම්කරු දීමනාව හා ප්‍රවාහත දීමනාව ලබා නොදුන් බවද ඊට අනුරූපව තමන්ට කම්කරු දීමනාව වශයෙන් 646000/- ප්‍රවාහන දීමනාව වශයෙන් රු.195000/- ක්ද ලැබිය යුතුව තිබෙන බවද ඉන් ඉක්බිතිව බේරුම්කරණය ඉදිරියේ කම්කරු දීමනාවෙන් රු 267000/- ක්ද ප්‍රවාහන දීමනාවන් රු 45000/- ක් ද ගෙවන ලද බව ද ප්‍රකාශ කළ සාක්ෂිකරු තමන්ට මේ වන විට එකී දීමනාවන්හි හිග මුදල වශයෙන් රු. 530000/- ක මුදලක් ලැබිය යුතුව තිබෙන බවද කියා සිටියේය.

මෙම පළමු පැමිණිලිකරු තවදුරටත් සාක්ෂි දෙමින් තමන්ගේ පත්වීම් ලිපිය A1 වශයෙන් සලකුණු කරන ලදි. එහි දෙවන ඡේදය දැනට උද්ගතව පවත්නා ආරාවුල සම්බන්ධයෙන් සෘජුව බලපෑමක් ඇති කරයි. එනම් එහි ඉතා පැහැදිලිව මාසික වැටුප පිළිබඳවත් ඊට අමතරව ප්‍රවාහන දීමනාව මෙන්ම කම්කරු දීමනාව පිළිබඳවත් සඳහන්ව තිබේ. එම පත්වීම ලිපියේ එම කොන්දේසියට බැහැරව ප්‍රවාහන දීමනාව සහ කම්කරු දීමනාව පිළිබඳව කිසිදු කරුණු දැක්වීමක් ඇතුළත් කර ඇති බවක් නොපෙනේ. එහෙත් දෙවන පැමිණිලිකරුගේ පත්වීම් ලිපියේ ප්‍රවාහන දීමනාව පිළිබඳව වැඩි මනක් කරුණු අන්තරගතව පවත්නා බවද පෙනි යයි. එම පත්වීම් ලිපියේ දෙවන ඡේදය

යටතේ දෙවන පැමිණිලිකරුගේ ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙන්ම ප්‍රවාහන දීමනාව හා කම්කරු දීමනාව පිළිබඳව ද කරුණු දක්වා ඇත. ඊට අමතරව අපේක්ෂිත ආකාරයටම ප්‍රගතියක් පෙන්නුම් කිරීමට ඔබ අපොහොසත් වුවහොත් ඔබට ගෙවන මාසික ප්‍රවාහන දීමනාව යම් ප්‍රමාණයකින් අඩු කිරීමට මෙම අරමුදලට බලය ඇති බව සැලකිය යුතු වේ. යනුවෙන් විශේෂිත පැහැදිලි කිරීමක් සිදු කර තිබෙන බව A3 දරන ලේඛනය පරිශීලනය කිරීමෙන් පෙනි යයි. මෙහිදී උද්ගත වන ගැටලුව වන්නේ ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් වන ප්‍රගතිය මැන බැලීම සඳහා කුමන මිනුම් දඬු භාවිතා කෙරෙන්නේ ද යන්න කිසිදු තැනක සඳහන්ව නොතිබිමයි. පත්වීම් ලිපියට එවැනි කොන්දේසියක් ඇතුළත් කළේ නම් ඒ පිළිබඳව පැහැදිලි කිරීම පත්වීම් ලිපිය තුළින්ම කළ නොහැකි බව සත්‍යයක් වුවත් ඒ සඳහා ආයතන තුළ වූ නියෝගයක් හෝ චක්‍රලේඛ මගින් හෝ කරුණු පැහැදිලි කිරීම සිදු කළ යුතුව තිබුණි. නඩු විභාගයේදී එවැනි කිසිවක් ඉදිරිපත් වූයේ නැත. අනෙක් අතට ඉස්මතුව ඇති ආරාවුල ප්‍රවාහන දීමනාව අඩු කිරීමක් පිළිබඳව නොව එය එක්තරා කාල පරිච්ඡේදයක් තුළ සම්පූර්ණයෙන්ම ගෙවා නොතිබිමක් පිළිබඳව උද්ගත වුවකි. ඒ කෙසේ වෙතත් පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් තම තනතුර අනුමත කාර්යය මණ්ඩල තනතුරක් බවත් ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන විධායක නිලධාරිගේ උපදෙස් පරිදි කළමනාකරුවන් කටයුතු කළ යුතුව තිබෙන බවත් ආයතනය පාඩු ලැබීමට හේතුව ප්‍රධාන කාර්යාලයේ දුර්වල පරිපාලනය බවත් ප්‍රකාශ කර සිටියේය. එමෙන්ම මෙම තත්ත්වය මත තිබෙන කර්මාන්ත ශාලාවේ තේ නිෂ්පාදන කටයුතු 2016 පෙබරවාරි මස සිට නතර වූ බවත් ඔහු වැඩිදුරටත් කියා සිටියේය. වග උත්තරකාර පාර්ශ්වය විසින් සාක්ෂිකරුගෙන් අසන ලද තවත් ප්‍රශ්නයක් වූයේ

ප්‍ර: කම්කරු දීමනාව හා ප්‍රවාහන දීමනාව ලබා දීමේ අරමුණ වන්නේ තේ නිෂ්පාදන කටයුතු පහසු කරන්න කියලා ? යන්නයි

ඊට පිළිතුරු දෙමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ.

උ: පරිපාලන කටයුතු පහසු කරන්න තමයි ලබා දෙන්නේ පරිපාලන කටයුතු කරද්දී නිල නිවාසේ වැඩ කටයුතු කරන්න සේවකයන් යොදවා ගන්න බැරි නිසා තමයි වෙනම අපි දෙදෙනෙක්ව (02) පෞද්ගලිකව යොදවා ගත්තේ පෞද්ගලිකව නිල නිවාසේ වැඩ කරන දෙන්නා කම්හලේ වැඩවලට අපි යොදවන්නේ නැහැ. රු 15000/ ක් ලබා දී තිබෙන්නේ ඉන්ධන සඳහා පමණයි. අපට වාහන ලබා දී නැහැ. අපේ පෞද්ගලික වාහන තමයි අපි ඒ සඳහා පාවිච්චි කරන්නේ

පළමු සාක්ෂිකරුගේ ඉහත ප්‍රකාශයෙන් වෙනත් කරුණු ඉදිරිපත් වීමෙන් පැහැදිලි වන්නේ කම්කරු දීමනාව යනු කළමනාකාරවරයාගේ නිල නිවසේ වැඩ කටයුතු සඳහා කම්කරුවන් දෙදෙනෙකු සේවයේ යොදවා ගැනීම සඳහා කරනු ලබන ගෙවීමක් බවටය. ඔවුන් දෙදෙනා කම්හල් රාජකාරිවල නිරත කිරීමක් සිදු නොකරයි. මේ සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වය කිසිදු අභියෝග කිරීමක් සිදු කර නැත. ඉන් බැහැරව වැඩිදුරටත් මේ පිළිබඳව අවධානය යොමු කරන්නේ නම් පළමු සාක්ෂිකරුගේ මුල් පත්වීම වර්ෂ 2004 ක්වූ ඔක්තෝබර් මාසයේදි බව A1 ලේඛනය අනුව තහවුරු වන බවත් එතැන් සිට වර්ෂ 2016 දක්වා වූ වසර 12 කට ආසන්න කාලයක් තුළ පත්වීම් ලිපියේ දෙවන ඡේදය දැක්වෙන දීමනාවන්හි කිසිදු වෙනසක් සිදු කර නොමැති බවත් පැහැදිලිව පෙනි යන කරුණකි. එපමණක්ද නොව කම්කරු දීමනාව ලබා දීම සම්බන්ධයෙන් කළමනාකරුවන් කිසිදු සාධක ඉදිරිපත් කිරීමක් කළ යුතු බවට නියමයන් ක්‍රියාත්මක වී ඇති බවක්ද නොපෙනේ. කම්කරුවන් සේවයේ යොදවා ගත්ත ද නොගත්ත ද එය නොසලකා හරිමින් සාමාන්‍ය ගෙවීමක් වශයෙන් කම්කරු දීමනාව සිදු කර තිබෙන බවක් ද පැහැදිලිව පෙනී යයි තවද පැමිණිල්ලේ පළමු සාක්ෂිකරු ප්‍රවාහන දීමනාව සම්බන්ධයෙන් අධිකරණය විසින් විමසන ලද ප්‍රශ්නයන්ට පිළිතුරු දෙමින් පහත පරිදි කරුණු දක්වා තිබේ.

ප්‍ර: තමා පිළිගත්තා 2016 පෙබරවාරි මාසයේ සිට කර්මාන්ත ශාලාවේ වැඩ නතර වුනා සියලා ?

උ: ඔව්

ප්‍ර: කර්මාන්ත ශාලාව වැඩ කරද්දී රු 15000/- ක ප්‍රවාහන දීමනාව ගෙව්වා?
උ: ඔව්

ප්‍ර: කර්මාන්ත ශාලාව වැඩ නතර කලාට පසුව තමාට යම් ප්‍රමාණයක රාජකාරී කටයුතු වෙනස්වීමකට ලක් වුනාද?
උ: රාජකාරි කටයුතු අඩු වුණා

ප්‍ර: තමා කම්හල් කළමනාකරු හැටියට කම්හලේ නිෂ්පාදන කටයුතු 2016 පෙබරවාරි මාසෙන් පසුව නැවතුනාට පසුව ඉන්පසුවත් ඒ ආකාරයෙන්ම රාජකාරි කටයුතු තිබුණාද?

උ: යම් ප්‍රමාණයකින් අඩු වුණා.

ප්‍ර: එය ප්‍රවාහන දීමනාවට බලපෑමක් ඇති වෙනවාද?

උ: යම් බලපෑමක් ඇති වෙනවා.

එසේම නඩු විභාගයේදී පැමිණිල්ලේ පළමු සාක්ෂිකරුගෙන් ප්‍රවාහන දීමනාව සම්බන්ධව කරන ලද ප්‍රශ්න කිරීම්වලදී ඔහු ඉතා පැහැදිලිව පිළිතුරු දෙමින් ප්‍රකාශ කර ඇත්තේ 2016 පෙබරවාරි මස සිට කම්හල් රාජකාරි නතර කිරීම හේතු කර ගෙන තමන්ට පැවරී තිබූ

රාජකාරි යම් ප්‍රමාණයකින් අඩු වීමක් සිදු වූ බවයි. එහෙත් මෙම තත්ත්වය පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරු විසින් සලකුණු කරන ලද A3 ලේඛනයේ දෙවන ඡේදය සඳහන් පරිදි අපේක්ෂිත ආකාරයට ප්‍රගතියක් පෙන්නුම් කිරීමට අපොහොසත් වුවහොත් ගෙවනු ලබන මාසික ප්‍රවාහන දීමනාව යම් ප්‍රමාණයකින් අඩු කිරීම යන කොන්දේසියට යටත් කළ හැක්කක් නොවේ පැමිණිල්ල වෙනුවෙන් එහි දෙවන සාක්ෂිකරු ලෙස ආනන්ද ධනසිරි යන අය සාක්ෂි දෙමින් ප්‍රකාශ කළේ තමා 2009 වර්ෂයේ ජූලි මස සිට කම්හල් කළමනාකාර පත්වීම් ලද බවයි. අවසානවරට ඇල්පිටිය කර්මාන්ත ශාලාවේ සේවය කරමින් සිටියදී වර්ෂ 2016 දෙසැම්බර් මස 31 දින තමාගේ සේවය අවසන් කරන ලද බව ඔහු වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ප්‍රකාශ කර සිටියේය. තමන්ට කම්කරු දීමනාව හා ප්‍රවාහන දීමනාව 2016 මාර්තු මස සිට 2016 දෙසැම්බර් මස දක්වා ලැබිය යුතුව තිබෙන බවද ඔහු කියා සිටියේය. ඒ කෙසේ වෙනත් මෙම සාක්ෂිකරු සාක්ෂි ලබා දීමේදී අනවබෝධයෙන් හෝ නොසැලකිල්ලෙන් සාක්ෂි ලබා දෙන බවත් නිරීක්ෂණය විය.

ප්‍ර: කවදා සිට ද ඇල්පිටිය කර්මාන්ත ශාලාවේ තේ නිෂ්පාදන කටයුතු නතර වුනේ ?

උ: නතර වුණා.

ප්‍ර: කවදා සිට ?

උ: දන්නේ නැහැ.

ප්‍ර: කවදා හෝ නතර වුණා නේද?

උ: ඔව්.

ප්‍ර: නතර වන විට තමාගේ කම්හලේ කළමනාකරු ලෙස තමන්ගේ රාජකාරි කටයුතුවල වෙනසකට භාජනය වුණාද ?

උ: නැහැ.

ප්‍ර: තේ දළු ගෙනත් රාජකාරි කරද්දි වැඩ තිබෙනවා. තේ දළු ගේන්නේ නැතිව නිෂ්පාදන කරන්නේ නැතිව තියෙද්දි තමාගේ රාජකාරි කටයුතු එසේම තිබුණාද ?

උ: ඔව් නිමි තේ තොගයක් තිබුණා.

එමෙන්ම හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු මෙසේ ප්‍රකාශ කර ඇත.

ප්‍ර: දැන් එතකොට සාක්ෂිකරු දන්නවා 2016 පෙබරවාරි මස සිට තේ නිෂ්පාදනය අත්හිටුවනවා කියලා ?

උ: ඔව්. මට දිනය හරියට මතක නැහැ. මගේ කම්හලේ ඊට පසුව නිෂ්පාදනය නතර වුනේ.

ප්‍ර: කොයි කාලේ වගේද නතර වුනේ ?

උ: මට එහෙම මතකයක් නැහැ.

ප්‍ර: 2016 මාර්තු වගේ වෙන කොට අවසානයි නේද ?

උ: නැහැ. එහෙම මතක නැහැ.

ප්‍ර: ඔබ මූලික සාක්ෂියේදී පිළිගත්තා නේද 2016 පෙබරවාරි මස වන විට කම්හලේ නිෂ්පාදනය අඩාල වුණා කියලා. එතකොට සාක්ෂිකරු බොරු සාක්ෂි ද අධිකරණයේ ඉදිරිපත් කලේ ?

උ: අමු දලු ගන්න එක නතර කළා කියලා කිව්වේ.

ප්‍ර: නිෂ්පාදන නතර කළා කියලා නේද කිව්වේ?

උ: අමු දලු ලබා ගෙන නිෂ්පාදන නතර කළා කියලා කිව්වේ. අමු දලු නැති වුනාම නිෂ්පාදනය අඩාල වෙනවා.

පැමිණිල්ලේ දෙවන සාක්ෂිකරුගේ සාක්ෂිය අවසානයේ වෙනත් සාක්ෂි ඉදිරිපත් නොකරන බව දැනුම් දීම නිසා වග උත්තරකාර පාර්ශ්වයට නඩුව ආරම්භ කර සාක්ෂි මෙහෙය වීමට අවස්ථාව ලබා දීමට තීරණය කළෙමි. ඒ අනුව වගඋත්තරකාර පාර්ශ්වය ආයතනයේ කළමනාකරණ සේවා නිලධාරි ධූරය දරන ලද ඉන්දික කුමාර වැලිකල යන අයගේ සාක්ෂිය මෙහෙය විය. එහිදී සාක්ෂිකරු කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටියේ තේ ශක්ති අරමුදල 2008 වර්ෂයේ සිටම සම්මත ව්‍යාපෘතියට අඛණ්ඩව පාඩු ලද බවත් 2016 වර්ෂයේ මුල් කාලය වන විට ප්‍රාග්ධන ගැටලු උද්ගත වීම මත තවදුරටත් පවත්වා ගෙන යා නොහැකි වූ බවත්ය. මෙම නඩු කටයුත්තට පාදක වී ඇති වලහංදුව හා ඇල්පිටිය යන කර්මාන්තශාලාවන්හි නිමි තේ නිෂ්පාදන 2016 පෙබරවාරි මාසයෙන් පසුව සිදු වී නොමැති බවද ඔහු පිළිගත්තේය. ඇල්පිටිය කර්මාන්ත ශාලාව අංක MF1504 යටතේ ලියාපදිංචි වී ඇති බවද සාක්ෂිකරු පැහැදිලි කර සිටියේය.

ප්‍ර: කුමක් ද එම අංකය?
උ: MF1504 ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ලියාපදිංචි කරලා තිබෙන්නේ මෙම අංකය යටතේ.
ප්‍ර: එහි අවසන්වරට නිමි තේ වෙන්දේසියට ඉදිරිපත් කළ දිනය සඳහන් වෙනවා නේද?
උ: 2016 පෙබරවාරි

වලහන්දුව කර්මාන්ත ශාලාවද 2016 වර්ෂයේ පෙබරවාරි මස අවසන් වරට තේ දලු ලබා ගත් බවට ද සාක්ෂිකරු කරුණු දක්වා තිබේ.

ප්‍ර: ඒ වලහංදුව කර්මාන්ත ශාලාවේ කුමක්ද ලියාපදිංචි අංකය?
උ: MF0815
ප්‍ර: MF0815 කර්මාන්ත ශාලාව අවසන් වරට තේ දලු ලබා ගන්න - වර්ෂය හා මාසය සඳහන් වන්නේ කවදාද?
උ: 2016 පෙබරවාරි

එහිදී වැඩිදුරටත් සාක්ෂි ලබා දෙමින් ඔහු ප්‍රකාශ කර සිටියේ මෙම කර්මාන්ත ශාලාවලට අදාළව ද 2016 පෙබරවාරි මාසයෙන් පසුව TCY වාර්තා ඉදිරිපත් නොවූ බවයි. TCY වාර්තා ඉදිරිපත් නොවීමෙන් අදහස් වන්නේ එකී කර්මාන්ත ශාලා ක්‍රියාත්මක වීමක් සිදු වී නොමැති බවය. මේ අනුව සලකා බලන විට පැමිණිලි පාර්ශ්වය මෙම වගඋත්තරකාර පාර්ශ්වය යන දෙපාර්ශ්වයට 2016 පෙබරවාරි මාසයෙන් පසුව නිමි තේ නිෂ්පාදන කටයුතු ක්‍රියාත්මක නොවූ බව හබ කිරීමෙන් තොරව පිළිගෙන තිබෙන බව පෙනී යයි. එමෙන් අංක 37/2016 දරන හා 2016.06.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය මගින් තේ ශක්ති අරමුදල ප්‍රතිව්‍යුගත කරන ලද බවද සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් ප්‍රකාශ කර සිටියේය. ඉන් ඉක්බිතිව පැමිණිලිකරුවන් දෙදෙනා ඇතුලු අනෙකුත් සේවකයන්ට සේවය අවසන් කිරීම වෙනුවෙන් වන්දි මුදල් ගෙවීම ද පාරිතෝෂික මුදල් ගෙවීම ද සිදු කර තිබෙන බවට සාධක සහිතව කරුණු දක්වා තිබේ. මේ සම්බන්ධයෙන්ද පැමිණිලිකාර පාර්ශ්වය කිසිදු හබ කිරීමක් සිදු කළේ නැත. දීමනා සම්බන්ධයෙන් කරුණු දක්වමින් සාක්ෂිකරු ප්‍රකාශ කර සිටියේ කම්කරු දීමනාව වෙනම වවුචර්පතක් මගින් ගෙවන බවත් ප්‍රවාහන දීමනාව දීමනාවක් විදිහට වැටුපට එල්ලා තිබෙන බවත් එය සේවක අර්ථ සාධක හා සේවා නියුක්ති අරමුදල් සඳහා පාදක කර ගන්නේ නැති බවත්ය. මින් පැහැදිලි වන්නේ පත්වීම් ලිපියේ දෙවන ඡේදය දැක්වෙන පරිදිම ඒවා වැටුපේ කොටසක් නොවන බවත් හුදෙක් දීමනාව පමණක් වන බවත්ය. තවද සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පහත පරිදි ප්‍රකාශ කර ඇත.

ප්‍ර: කම්හලේ කම්කරුවන් ඉන්නවාද සේවය කරන්න?
උ: ඔව්.
ප්‍ර: තව කම්කරුවන් දෙදෙනෙක් කළමනාකරුට දෙන්නේ කම්හලේ වැඩවලටද?
උ: නැහැ.
ප්‍ර: එසේ නම් කොහේ වැඩ වලටද?
උ: නිල නිවාසයේ වැඩවලට

එමෙන්ම බේරුම්කරණය විසින් අසන ලද ප්‍රශ්නවලට සාක්ෂිකරු පහත සඳහන් ආකාරයෙන් පිළිතුරු සපයා ඇත.

ප්‍ර: පත්වීම් ලිපියේ යම් කොන්දේසියක් තිබෙනවා නම් එම කොන්දේසියෙන් ආයතනය බැහැර වෙනවා නම් ඒ ගැන දැනුම් දීමක් කරන්න ඕන කියලා පිළිගන්නවාද?
උ: ඒ අවස්ථාවේ තිබුණ ව්‍යාකුල තත්ත්වය එක්ක දීමනාව විතරක් නොවේ පඩි ගෙවා ගන්න බැරි තත්ත්වයක් තිබුනේ.
ප්‍ර: කුමක් ව්‍යාකුල තත්ත්වය කියන්නේ?
උ: කාරක ප්‍රාග්ධන ගැටලුව එක්ක ආයතනයේ සල්ලි නැතිව ගියා. ඒ නිසා ගෙවා ගැනීමේ හැකියාවක් නැතිව ගියා. අපිටත් මාස 4 ක් පඩි ගෙව්වේ නැහැ. පසුව තමයි ගෙව්වේ.
ප්‍ර: වගඋත්තරකාර ආයතනය විශ්වාස කරනවා නම් මෙම දීමනාව 2016 මාර්තු සිට 2016 දෙසැම්බර් වෙනකන් හිමි නැහැ කියලා ඒ පිළිබඳව දැනුම් දිය යුතුව තිබුණා කියලා පිළිගන්නවාද?
උ: එම දීමනා දෙක දෙන හේතුව දක්වා තිබෙනවා. කම්කරු දීමනාව සහ ප්‍රවාහන දීමනාව කියලා ඒ අදාළ කාර්යයන් නැති නිසා එම දීමනා නතර වුණා.
ප්‍ර: 2016 මාර්තු වෙද්දි වගඋත්තරකාර ආයතනය තීරණයක් ගත්තා නම් කළමනාකරුවන්ට දැනුම් දෙන්න තිබුණා නේද?
උ: ඒ වෙලාවේ දැනුම් දෙන්න පුලුවන් තත්ත්වයක් ආයතනය තිබුනේ නැහැ.
ප්‍ර: දැනුම් දුන්නේ නැද්ද? ලියුමකින්වත් දැනුම් දුන්නේ නැද්ද?
උ: නැහැ
ප්‍ර: රංජිත් ගොඩකන්ද ආරච්චි මහතාට හා ආනන්ද ධනසිරි මහතාට 2016 මාර්තු සිට දෙසැම්බර් දක්වාම ප්‍රවාහන දීමනාව සහ කම්කරු දීමනාව යන දෙකම ගෙවන්නේ නැති බව පිළිගන්නවාද?
උ: ආයතනය ගෙවලා නැහැ. 2016 මාර්තු සිට 2016 දෙසැම්බර් දක්වා

කළමනාකරුවන්ගේ පත්වීම් ලිපිවල කොන්දේසියක් වශයෙන් ඇතුළත්ව ඇති කම්කරු දීමනාව හා ප්‍රවාහන දීමනාව ඔවුන් වෙත 2016 මාර්තු මස සිට දෙසැම්බර් මස දක්වාම නොගෙවා ඇති බවත් තේ නිෂ්පාදන කටයුතු නතර කිරීම නිසා එම දීමනා නොගෙවීමට තීරණය කර ඇති බවත් ඒ පිළිබඳව ඒකපාර්ශ්වීය වශයෙන් හෝ ආයතනය විසින් කළමනාකරුවන් වෙත දැනුවත් කිරීමට කටයුතු කර නොමැති බවත් වගඋත්තරකාර පාර්ශ්වයේ සාක්ෂිකරුගේ සාක්ෂියෙන් මනාව තහවුරු වේ.

*ප්‍රදානය*

පැමිණිලි පාර්ශ්වයේ සහ වගඋත්තරකාර පාර්ශ්වයේ සියලු සාක්ෂිවලින් මෙන්ම සලකුණු කරන ලද ලේඛනවලින් ද සනාථ වන්නේ ඉල්ලුම්කරුවන් දෙදෙනාට ඔවුන්ගේ පත්වීම් ලිපිවල දෙවන ඡේදයේ ඇතුළත් කොන්දේසියට අනුව ප්‍රවාහන දීමනාව සහ කම්කරු දිමනාව මාසිතව ලැබීමට හිමිකම තිබෙන බවයි. එහෙත් අදාළ කර්මාන්ත ශාලාවන්හි තේ නිෂ්පාදන කටයුතු නතර වීමෙන් පසු එනම් වර්ෂ 2016 පෙබරවාරි මාසයෙන් පසු ඔවුන් දෙදෙනා මෙකී දීමනාවන් ලැබීමට තවදුරටත් හිමිකම් ලබන්නේද යන්න විසඳිය යුතුව ඇති එක් මූලික ගැටලුවකි. නිමි තේ නිෂ්පාදනය සඳහා අමු තේ දලු රැස් කිරීමත් ඒ හා බැඳුන අනෙකුත් කාර්යයන් සඳහාත් කළමනාකරුවෙකු ප්‍රවාහන දීමනාවට හිමිකම් ලැබීමට හේතු වන බවද ඒ සඳහා ඔවුන් වෙත වාහනයක් ලබා දීමට ආයතනයේ බැඳීමක් නොපවත්තා බවද ඉදිරිපත් සාක්ෂි මගින් තහවුරු විය. එමෙන්ම වර්ෂ 2016 පෙබරවාරි මාසයෙන් පසු ඊට අදාළ රාජකාරි කටයුතුවල තමන් නොයෙදුන බවට ද පැමිණිලිකරුවන් සාක්ෂි ලබා දෙමින් පිළිගෙන තිබේ. පත්වීම් ලිපියේ දෙවන ඡේදයේ වැටුප පිළිබඳව කරුණු පැහැදිලට ඇතුළත්ව තිබුණද ප්‍රවාහන දීමනාව එහි කොටසක් වශයෙන් සලකන බවට එහි කරුණු දක්වා නැත. එ බැවින් එය හුදෙක් දීමනාවක් පමණි. එම දීමනාව ලැබීමට අත්‍යවශ්‍යම කාර්යයත් 2016 පෙබරවාරි මාසයෙන් පසු පැමිණිලිකරුවත් විසින් ඉටු කිරිමක් දැකිය නොහැකිය. මෙම තත්ත්වය වගඋත්තරකාර ආයතනයේ ඉහළ පරිපාලනය විසින් කළමනාකරුවන් දැනුවත් කර නොතිබීම ඉතා බරපතල ආකාරයේ පරිපාලනය දුර්වලතාවයකි. ඒ කෙසේ වෙතත් අදාළ ගෙවීම් දීමනාවක් බව ඉතා පැහැදිලි වන නිසාත් ඊට අදාළ කාර්යයන්හි නිරතවිමක් පැමිණිලිකරුවන් විසින් ඉටු කිරීම සිදු වී නොමැති නිසාත් වර්ෂ 2016 මාර්තු මස සිට 2016 දෙසැම්බර් මස දක්වා එනම් ඔවුන්ගේ සේවය අවසන් කරන දින දක්වා ප්‍රවාහන දීමනාව ලැබීමට ඔවුන්ට හිමිකමක් නොමැති බවට තීරණය කරමි. එසේම මෙම පැමිණිලිකරුවන් විසින් අයැද සිටින කම්කරු දීමනාව සම්බන්ධයෙන් කරුණු සලකා බලන විට ඒ පිළිබඳව ද ඔවුන්ගේ පත්වීම් ලිපියේ දෙවන ඡේදයේ යටතේම කරුණු දක්වා තිබෙන බවත් පෙනී යයි. එම ඡේදයට අනුව කම්කරු දීමනාවද වැටුපේ කොටසක් නොවන අතර එය ද හුදෙක් දීමනාවක්ම පමණි. මේ බව වඩාත් සනාථ වන කරුණක් වන්නේ මෙම කම්කරු දීමනාව වැටුප් පත සමග නොව වෙනම වවුචරපත් මගින් ගෙවිමට කටයුතු කර තිබීමය. එපමණක් ද නොව එම දීමනා සේවක අර්ථ සාධක අරමුදල සඳහා හා සේවා නියුක්ති භාර අරමුදල සඳහා ද ගණනය කිරීමක් සිදු කර නැත. ඉදිරිපත් සාක්ෂි හා සාධක අනුව එක් කළමනාකරුවෙකුට කම්කරුවන් දෙදෙනෙකුද තම නිල නිවසේ සේවා කටයුතු සඳහා යොදවා ගැනීමට අවසර දී තිබෙන අතර ඒ සඳහා මාසිකව ගෙවීම් සිදු කර ඇත. මෙම නඩුවට අදාළ පැමිණිලිකාර කළමණාකරුවන් දෙදෙනාම අදාළ කාලය තුළ විශේෂයෙන්ම 2016 මාර්තු මස සිට 2016 දෙසැම්බර් මස දක්වාම රාජකාරි නිල නිවාසයක් භාවිතා කර තිබේ. ඒ අනුව එහි කම්කරුවන් “බංගලා සේවකයන්’’ වශයෙන් සැලකිය හැකිය. තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවට අනුකූලව සලකා බලන විට බංගලා සේවකයන් තේ වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳව පඩි පාලක සභාවෙත් ආවරණය වන්නේ නැත. අනෙක් අතට මෙ බංගලා සේවකයන් දෙදෙනා නිල නිවාසයේ සේවයේ නිරත කරනවා විනා කම්හලේ සේවයේ යෙදවීමක්ද නැත. එසේ නම් කළමනාකරු වර්ෂ 2016 පෙබරවාරි මාසයෙන් පසුව නිමි තේ නිෂ්පාදනය සම්බන්ධව වූ රාජකාරී කටයුතුවල නිරත නොවුවද සිය නිල නිවසේ රැඳී සිට තිබේ. එම නිසා ඔහුට කම්කරුවන් දෙදෙනකු බංගලා සේවකයන් වශයෙන් සේවයේ යොදවා ගැනිමට සම්පූර්ණ හිමිකම ඇති බවට තීරණය කරමි. නඩු විභාගයේදි ඉදිරිපත් වූ සාක්ෂි අනුව මෙම පැමිණිලිකාර කළණාකරුවන් දෙදෙනාට කම්කරු දීමනාව වශයෙන් පහත සඳහන් මුදල වගඋත්තරකාර සමාගම විසින් ගෙවිය යුතුය.

| *නම* | *දීමනාව* | *කාල පරිච්ඡේදය* | *මුදල* |
|---|---|---|---|
| 1. රංජිත් ගොඩකන්ද ආරච්චි | කම්කරු දීමනාව | 2016 මාර්තු සිට 2016 දෙසැම්බර් දක්වා | රු 380000.00 |
| 2. ආනන්ද ධනසිරි | කම්කරු දීමනාව | 2016 මාර්තු සිට 2016 දෙසැම්බර් දක්වා | රු 380000.00 |
| | | එකතුව | රු. 760000.00 |

මෙහි නම් සඳහන් අයට ලබා ගත හැකි වන සේ රුපියල් හත්ලක්ෂ හැට දහසක (රු.760000.00) මුදල 2025 ජූලි මස 31 දින හෝ ඊට පෙර නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස්වරයාගේ නමට බැර කරන ලෙස මින් නියෝග කරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව මින් සහතික කරමි.

**ලොරා සුමතිපාල,**
බේරුම්කරු

EOG 06 – 287

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.